

2020

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය.

நவீன தொழில்நுட்பவியலுக்கான ஆர்தர் சி. கிளார்க் நிறுவகம்.

Arthur C. Clarke Institute for Modern Technologies.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
වාර්ෂික වාර්තාව 2020

පටුන	පිටු අංකය
1. සාමාන්‍ය තොරතුරු	1
1.1 පාලන ව්‍යවස්ථාව	1
1.2 ඉදිරි දැක්ම	1
1.3 මෙහෙවර	1
1.4 පාලනය කරන අමාත්‍යාංශය	1
1.5 පාලක මණ්ඩල සාමාජිකයින්	2
2. විධායක සාරාංශය	3
3. ආයතනයේ අංශ	7
4 මූලික ව්‍යාපෘතිවල කාර්ය සාධනයේ විශේෂ අවස්ථා	8
5. පර්යේෂණ වැඩසටහන් හා තාක්ෂණ සේවාවන්	11
5.1 කර්මාන්ත සඳහා ආරම්භ කර ඇති ඉංජිනේරු තොරතුරු තාක්ෂණ අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්	11
5.2 ඉංජිනේරු / තොරතුරු තාක්ෂණ අංශයේ ආයතනික පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති	12
5.3 කොවිඩ්-19 අදාල වැඩිදියුණු කිරීම්	19
5.4 තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති	21
5.5 දූරස්ථව සංනිවේදනය (RS) හා භූගෝලීය තොරතුරු පද්ධති (GIS) සම්බන්ධ පර්යේෂණ ව්‍යාපෘති	23
5.6 පර්යේෂණ ප්‍රකාශන	26
5.7 පරීක්ෂා කිරීම් හා මිනුම් දෘඩකාංග පිළිසකර කිරීම් හා උපදේශක සේවා	27
6. පුහුණු අධ්‍යාපන හා තොරතුරු බෙදාහැරීම	30
6.1 වෘත්තිකයින් සඳහා අඛණ්ඩ වෘත්තීය පුහුණු සංවර්ධන (CPD) වැඩසටහන්	30
6 2 මූලික හා මධ්‍යම මට්ටමේ තාක්ෂණික පුහුණු	31
6 3 විද්‍යාව හා තාක්ෂණ ජනප්‍රිය කිරීම හා තොරතුරු බෙදාහැරීම සහ තාරකා විද්‍යාව හා අභ්‍යවකාශ විද්‍යාව ජනප්‍රිය කිරීමේ වැඩසටහන	31
6.4 ACCIMT පුස්තකාලය	32
7. මානව සම්පත් සංවර්ධනය	34
8. 2020 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන	35
9. සැළසුම් කළ කෙටි හා මධ්‍ය කාලීන ක්‍රියාකාරකම් සාරාංශය	59
10. විගණකාධිපති වාර්තාව 2020	61
11. 2020 වසර සඳහා විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	68

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
කටුබැද්ද,
මොරටුව

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය,
3වන මහල, සෙත්සිරිපාය පළමු අදියර,
බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමියනි,

2020 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වන කාල සීමාව සඳහා නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව.

2013 අංක 32 දරණ පනත මගින් සංශෝධිත 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ VII කොටසේ 40 වන වගන්තියට අනුකූලව පහත සඳහන් ලේඛණ ද සමගින් නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2020 වසර සඳහා වන වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද ගෞරවයක් කොට සලකමි.

(අ) විගණනය කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පිටපතක්
(ආ) විගණන කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශයේ පිටපතක් සහ
(ඇ) විගණකාධිපති වාර්තාව හා ඒ පිළිබඳව ආයතනයේ නිරීක්ෂණ

මෙයට,

විශ්වාසී.

ඉංජිනේරු සනත් පනාවැන්නගේ
අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

1. සාමාන්‍ය තොරතුරු

1.1. පාලන ව්‍යවස්ථාව

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත සංස්ථාවකි. 1984 අංක 30 දරණ පනත මගින් පිහිටුවන ලද නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ අනුප්‍රාප්තිකයා ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත යටතේ 1998 අප්‍රේල් මස 01 දින නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය ස්ථාපනය කර ඇත.

පනතේ දක්වා ඇති පරිදි නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ කාර්යභාරය පහත දැක්වේ:

(අ) ශ්‍රී ලංකාවට නවීන තාක්ෂණය හඳුන්වාදීම වේගවත් කිරීම සඳහා

(i) නවීන තාක්ෂණය අදාල කිරීමෙහිලා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආරම්භ කිරීමෙන්, ප්‍රවර්ධනය කිරීමෙන් හා පවත්වාගෙන යාම මගින්

(ii) නවීන තාක්ෂණය අදාල කිරීමෙහිලා රජයට සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර වලට පර්යේෂණ හා සංවර්ධන සහය සැලසීම මගින් සහ

(iii) රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාරයන්හි අවශ්‍යතාවය පිරිමසාලීම සඳහා නවීන තාක්ෂණ සම්බන්ධයෙන් පුද්ගලයින් පුහුණු කිරීම මගින් දායකවීම සහ

(ආ) අනාගත අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා

නවීන තාක්ෂණ ක්ෂේත්‍රයන්ට සන්නිවේදනය සහ ආශ්‍රිත විද්‍යාවන්, තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික, අභ්‍යවකාශ තාක්ෂණ, රොබෝ විද්‍යාව, ෆොටොනික්ස් සහ නව ද්‍රව්‍ය ඇතුලත්වේ.

1.2 ඉදිරි දැක්ම

නවීන තාක්ෂණය සඳහා කලාපය තුල ප්‍රමුඛතම නවෝත්පාදන මධ්‍යස්ථානය වීම.

1.3 මෙහෙවර

නවෝත්පාදන, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්, පුහුනු, කර්මාන්ත සේවා සහ අන්තර්ජාතික සහයෝගිතාව තුලින් දේශීය පදනමක් සහිත නවීන තාක්ෂණික හැකියාවන් සංවර්ධනය හා දිරිමත් කිරීමට පහසුකම් සැලසීම.

1.4 පාලනය කරන අමාත්‍යාංශය

උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවොත්පාදන අමාත්‍යංශය,
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යංශය.

1.5 පාලක මණ්ඩල සාමාජිකයින් - 2020

1.	මහාචාර්ය සිසිල් කුමාරවඩු	-	පාලක මණ්ඩල සභාපති
2.	ඉංජිනේරු සනත් පනාවැන්නගේ මයා	-	අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍ර.වි.නි - පාලක මණ්ඩල සාමාජික
3.	මහාචාර්ය කේ.පී.එස්. චන්දන ජයරත්න මයා	-	පාලක මණ්ඩල සාමාජික
4.	මහාචාර්ය කේ.කේ.සී.කේ. පෙරේරා මයා (2020 අගෝස්තු දක්වා) මහාචාර්ය එන්.ඩී.ගුණවර්ධන	-	පාලක මණ්ඩල සාමාජික
5.	මහාචාර්ය ඒ.කේ.ඩබ්.ජයවර්ධන මයා	-	පාලක මණ්ඩල සාමාජික
6.	මෙරික් ගුණාරත්න මයා	-	පාලක මණ්ඩල සාමාජික
7.	රාජිත දහනායක මයා	-	පාලක මණ්ඩල සාමාජික
8.	සුජේනා රණතුංග මිය	-	පාලක මණ්ඩල සාමාජික
9.	මහාචාර්ය එස්.ඒ.අරියදුරෙයි	-	පාලක මණ්ඩල සාමාජික
10.	උදේනි උඩුගහපත්තුව මිය	-	පාලක මණ්ඩල සාමාජික

2020 වසර තුල පවත්වනු ලැබූ පාලක මණ්ඩල රැස්වීම්

රැස්වීම් අංකය	රැස්වීම පැවති දිනය
2020/01	03/03/2020
2020/02	21/05/2020
2020/03	18/06/2020
2020/04	20/08/2020
2020/05	29/09/2020
2020/06	27/10/2020
2020/07	24/11/2020
2020/08	22/12/2020

2. විධායක සාරාංශය

කොවිඩ්-19 හේතුවෙන් සාමාන්‍ය මෙහෙයුම් සඳහා ඇතිවූ අවහිරතා මධ්‍යයේ වුවද, 2020 වසරේදී ආයතනයට විශේෂිත ක්ෂේත්‍රයන්හි පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවිය. එසේම පරීක්ෂා කිරීම් හා මිනුම් උපකරණ ක්‍රමාංකන සේවා සහ උපදේශණ සේවා වැනි තාක්ෂණ සේවාවන් සැළකූවිට ආයතනයට ඒ සඳහාද සැලකිය යුතු දායකත්වයක් දැක්වීමට හැකිවී තිබේ.

අභ්‍යවකාශ තාක්ෂණ අංශයේ ධාරිතා සංවර්ධනය සඳහා ජාතික වශයෙන් වගකීම් පැවරී ඇති ආයතනය ලෙස ACCIMT ආයතනය විසින් සය-ඒකක නැනෝ චන්ද්‍රිකාවක් (KITSUNE ලෙස නම්කළ) සැලසුම් කිරීම, වැඩිදියුණු කිරීම, පරීක්ෂා කිරීම හා මෙහෙයුම් කිරීම සඳහා අනෙක් සහයෝගිතා හවුල්කරුවන් ලෙස තවත් ජපන් කාර්මික ආයතන දෙකක් සහ සිංගප්පූරුවේ නැන්යැංග් තාක්ෂණ විශ්ව විද්‍යාලය සමග පස්-පාර්ශවීය සහයෝගිතා ව්‍යාපෘතියක් සඳහා සම්බන්ධවීම මගින් කියුෂු තාක්ෂණ ආයතනය (Kyutech) සමග 2019 වසරේදි ආරම්භ කරන ලද



සහයෝගීතාවන් අබණ්ඩව සිදුකරනු ලැබීය. නැනෝ චන්ද්‍රිකා තාක්ෂණයේ යම් වැදගත් අංග පිළිබඳව ACCIMT ආයතනයේ ඉංජිනේරුවන්ගේ තාක්ෂණික හැකියාවන් වැඩිදියුණුවීමේ අනගි අවස්ථාව හිමිවීමට අමතරව (මූල්‍යමය වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රාග්ධන වියදම් නොමැතිව ACCIMT ආයතනයේ දායකත්වය එහි ඉංජිනේරුවන් විසින් ලබාදෙන සේවාවන්ට පමණක් සීමාවන බැවින්) චන්ද්‍රිකාව ක්‍රියාත්මකවූ විට පෘථිවි නිරීක්ෂණ ඡායාරූප (5m විභේදනය), චන්ද්‍රකාවෙන් ලැබෙන දත්ත ලබාගැනීම/සම්ප්‍රේෂණය සබැඳියන් සහ චන්ද්‍රිකාවෙන් ජනනය වන දත්ත ඇතුලුව චන්ද්‍රිකාව මගින් ලබාදෙන සියලු පහසුකම් නොමිලේ ලබාගැනීමට ACCIMT ආයතනයට හැකිවනු ඇත.

අපනයන වෙළඳපල සඳහා නිෂ්පාදන හා උප එකලස්කිරීම් සපයන ප්‍රමුඛ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන ආයතනයකින් ලැබුණු ඉල්ලීමකට අනුව ස්කැන්ඩිනේවියානු රටවල නිවසින් බැහැර පරිසරයේදී කාන්තාවන්ට එරෙහි අපරාධ වැලැක්වීමට ඉවහල් වන උසස් ඉලේක්ට්‍රොනික පදනම් පුද්ගල ආරක්ෂක උපකරණයක් නිර්මාණය හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම මෙම වසර තුළ ආරම්භ කරන ලද වැදගත් නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ කාර්යයක්වේ. මෙම උපකරණය මොඩියුල තුනකින් සමන්විත වන අතර උසස් ඉලෙක්ට්‍රොනික පදනම් අතේ තබාගන්නා හදිසි දැනුම්දීමේ ඒකකය හා LED තීරුවක් සහිත ඉනපටිය ඇතුලුව සියලුම දෘඩකාංග ACCIMT ආයතනය විසින් වැඩිදියුණු කළ යුතුවේ. ස්මාර්ට් දුරකතනයක් භාවිතයෙන් සේවා සැපයුම්කරු සමග සන්නිවේදන යාන්ත්‍රණය වෙනත් පාර්ශවයක් විසින් සිදුකරනු ලැබේ. මෙම සහයෝගිතා ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම මගින් තාක්ෂණික දැනුම පාදක යෙදවුම් සැලකූවිට සුලු අගය එකතු කිරීමක් සහිත, පාරිභෝගික විශේෂ සැලසුම් හා ආනයනික උපාංග භාවිතයෙන් මහා පරිමාණ එකලස් කිරීම් මත මූලිකවම රඳාපවතින ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන හා අපනයන කර්මාන්තයේ වැදගත් සන්ධිස්ථානයන් සනිටුහන් කරනු ඇත.

තේ වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රතිලාභය සඳහා ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන ගණනාවන් වැඩිදියුණු කිරීම තවත් වැදගත් කර්මාන්ත ආශ්‍රිතව ආරම්භ කරන ලද සැලසුම් හා සංවර්ධන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය සඳහා එක්සත් රාජධානියේ මගින් මූල්‍ය සහය දක්වන අතර ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය ප්‍රධාන ප්‍රතිලාභියාවේ.








තවද, ආයතනය විසින් සේවාදායකයින්ගේ ඉල්ලීම් අනුව දෝෂ හඳුනාගැනීම හා උසස් දෘඩකාංග යථා තත්වයට පත්කිරීමේ සේවාවන් රැසක් සිදුකරනු ලැබීය. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ K8 පුහුණු ගුවන්යානාවල ගුවන් ගමන් පාලන මොඩියුලයේ දෝෂ පිළිසකර කිරීම එවන් එක් වැදගත් කාර්යයක්වේ. ACCIMT ආයතනය විසින් වැඩිදියුණු කරනලද විශේෂ පරීක්ෂා කිරීමේ මෘදුකාංගයක් භාවිතයෙන් දෝෂ සහිත මොඩියුල සාර්ථක ලෙස යථාතත්වයට පත්කරනු ලැබීය.

ආයතනයේ තවත් එවන් කාර්යයක් වන්නේ Class S9 දුම්රිය එන්ජින් දෙකක රියදුරුට දර්ශනය වන පාලන පුවරු (Driver Display sub systems) යථා තත්වයට පත්කරීමයි. සැළකිය යුතු ඉහළ පිරිවැයකට පිටරටවල් වලින් මෙම සේවාවන් මිලදී ගැනීමෙන් වැළකී මෙම කාර්යයන් සාර්ථකව නිමකිරීම මගින් රටට විදේශ විනිමය ඉතිරිකර ගැනීමට හැකිවේ.

සමාලෝචනයට ලක්වූ වසර තුළ ආරම්භ කරන ලද හෝ අඛණ්ඩව සිදුකරනු ලැබූ ආයතනික පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති වන්නේ, Xilinx FPGA තාක්ෂණය පදනම් තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය, විවිධ මෙහෙයුම් සඳහා තටු හතරක් සහිත ජල රෝධි කාබන් කෙඳි ඩ්‍රෝන යානය, විදුරු කෙඳි හා ටේල් සිටර් VTOL UAVs වැනි ඩ්‍රෝන නිර්මාණය හා වැඩිදියුණු කිරීම, පථයක ගමන් ගන්නා රෝවරයක් භාවිතයෙන් පොළව යට (පතල්) භූමිය සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය, අධිනාක්ෂණ පද්ධතිවල පූර්ව දැනුම්දීමේ නඩත්තු ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා අඩු වියදම් විසඳුමක්, පොලි ටනල සඳහා උෂ්ණත්ව අධීක්ෂණ/ පාලනය කිරීමේ පද්ධතිය, සහ බිම්ගැන්වීමේ ඝර්ෂණය අඩුකිරීම සඳහා ද්‍රව්‍ය වැඩිදියුණු කිරීමවේ.

තොරතුරු තාක්ෂණ අංශය විසින් 2020 වසරේදී තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ගණනාවත් සිදුකරනු ලැබීය එනම්, විශේෂිත යෙදවුම් සඳහා ජංගම දුරකතන යෙදවුම් (mobile apps) වැඩිදියුණු කිරීම්, ආයතනය විසින් භාරගනු ලැබූ වෙබ් අතුරු මුහුණත වැඩිදියුණු කිරීමේ සහය හා ආයතනය තුළ සිදුකරන කාර්යයන් සඳහා මෙන්ම බාහිර ගනුදෙනුකරුවන් සඳහා තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීමේ සහය ලබාදීම මීට ඇතුලත්වේ.





ආයතනයේ තාරකා විද්‍යා අංශය විසින් පර්යේෂණ ව්‍යාපෘති හතරක් සිදුකරනු ලැබීය. ඒවානම්, විචල්‍ය ද්විත්ව තාරකා පිළිබඳ පර්යේෂණය (චීනයේ යුනාන් නිරීක්ෂණාගාරය සමග සහයෝගිතා ව්‍යාපෘතිය), e-CALLISTO ජාලය සඳහා දිගු තරංග ඇන්ටනා පද්ධතිය නිර්මාණය කිරීම හා ඉදිකිරීම, Proxima Centauri b සහ Ross-128 b යන සෞරගුහ මණ්ඩලයෙන් පිටත පෘථිවියට ආසන්නව පිහිටි ග්‍රහලෝක දෙකෙහි අභ්‍යන්තර ව්‍යුහයේ ස්වරූපය හඳුනා ගැනීම සහ අගල් 14 මිඩ් දුරදක්නය දුරස්ථව පාලනය කිරීමේ හැකියාව සොයා බැලීමවේ.

මීට අමතරව අභ්‍යවකාශ තාක්ෂණ අංශයේ පහත සඳහන් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සිදුකරනු ලැබීය. එනම් දුරස්ථ සංවේදනය හා භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතයෙන් මුලතිවු අර්ධ ශුෂ්ක ප්‍රදේශයේ භූගත ජලය ගවේෂණය කිරීම, තිරසාර ඉඩම් භාවිතය කළමනාකරණය සඳහා රසල්ස් මොඩලය පදනම් කරගෙන පාංශු බාදන වේගය තක්සේරු කිරීම සහ SAR දත්ත භාවිතයෙන් කඩොලාන භෞමික පෙව් ස්කන්ධය ඇස්තමේන්තුගත කිරීම වේ.

2020 වසර තුළ ආයතනය විසින් රටේ කොවිඩ්-19 මැඩලිමේ කාර්යයන් සඳහා විවිධ අයුරින් දායක විය. රෝගීන්ගෙන් පෙව් සාම්පල ලබාගැනීම සඳහා ආරක්ෂිත කුටියක් නිපදවීම වඩාත් කැපීපෙනෙන ක්‍රියාකාරකමක්වේ. මෙය උසස් තාක්ෂණික නිෂ්පාදනයක් නොවූවද එමගින් එය පරිත්‍යාග කරනු ලැබූ රෝහල් හතර සඳහා ඉතා ඉහළ ප්‍රතිලාභයක් අත්විය. මීට අමතරව ආයතනය කොවිඩ්-19 දැනුවත් කිරීම් සඳහා පහසුකම් සැලසීම සහ අනුකූලතා අධීක්ෂණය සඳහා ජංගම දුරකතන යෙදවුම් (mobile apps) වැඩිදියුණු කිරීමේ කාර්යයේ නියලී සිටී. ආයතනය LAMP Assay තාක්ෂණය පදනම් කොවිඩ්-19 පරීක්ෂා කිරීමේ ක්‍රමයක් වැඩිදියුණු කිරීම සඳහා සහයෝගිතා හවුල්කරු ලෙස මොරටුව විශ්වවිද්‍යාලය සමග සහයෝගිතා පර්යේෂණයක් ආරම්භ කරනු ලැබීය.





ගෝලීය වසංගතය මධ්‍යයේ වුවද කාර්මික සේවා සඳහා ඇති ඉල්ලුම අනුව කාර්මික අංශයේ සේවාලාභීන් සඳහා සේවා සැපයීම යම් ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට ආයතනය කටයුතු කරනු ලැබීය. ආයතනය විසින් පිරිනමන ලද සේවාවන්ට ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් පරීක්ෂා කිරීම් හා මිනුම්, උපකරණ ක්‍රමාංකනය කිරීම, විවිධ වර්ගයේ ඉලෙක්ට්‍රොනික උපකරණ, උපාංග හා මොඩියුල, ලෙඩ් අම්ල බැටරි, හා සර්ජ් ආරක්ෂක උපකරණ වල කාර්ය සාධනය පරීක්ෂා කිරීම සහ සන්නිවේදන හා ගුවන් විදුලි ප්‍රචාර අංශ සඳහා පරීක්ෂා කිරීම් හා මිනුම් සේවා ඇතුලත්වේ. 2020 වසර තුල ආයතනය විසින් කාර්ය සාධන පරීක්ෂණ වාර්තා 122ක් හා ක්‍රමාංකන වාර්තා 104ක් නිකුත් කරනු ලැබීය. තවද උපදේශණ හා උසස් දෘඩකාංග යථා තත්වයට පත්කිරීමේ කාර්යයන් සැලකිය යුතු සංඛ්‍යාවක් සිදුකරනු ලැබීය. විදුලිසැර වලින් ආරක්ෂාවීමේ ක්ෂේත්‍රය සැලකුවිට ස්ථානීය පරීක්ෂා කිරීම් සිට පද්ධති නිර්මාණය කිරීම, විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ සේවාලාභීන් සඳහා ටෙන්ඩර ලේඛන පිලියෙල කිරීම හා ස්ථාපනය කිරීම් සහතික කිරීම දක්වා වන තාක්ෂණික උපදේශණ සේවා 20ක් සිදුකරනු ලැබීය.

ගෝලීය වසංගතය හේතුවෙන් පැවති දුෂ්කර තත්වය මධ්‍යයේ වුවද ඉහත විස්තර කරන ලද මට්ටමේ කාර්ය සාධනයක් ලගාකර ගැනීමට ආයතනය හැකිවූ අතර එසේම වෙළඳපළ අගයට වඩා අඩු පාරිතෝෂික මට්ටම හේතුවෙන් කාර්ය මණ්ඩලය බඳවාගැනීමේ හා රඳවා ගැනීමේ අපහසුතාව, දැඩිලෙස ක්‍රියා පටිපාටීන්ට අනුකූල පරිපාලන නියෝග හා අරමුදල් සීමාකිරීම යන බාධක මගින් ද නිරන්තරව ආයතනයේ කාර්ය සාධනයට බලපෑම් එල්ල විය.

ඉන්ජිනේරු සනත් පනාවැන්නගේ

අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරි

(පාලක මණ්ඩල සාමාජික)

3. ආයතනයේ අංශ

- ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය
- සන්නිවේදන / රොබෝ විද්‍යා අංශය
- කාර්මික සේවා අංශය
- අභ්‍යවකාශ තාක්ෂණ යෙදවුම් / අභ්‍යවකාශ තාක්ෂණ / තාරකා විද්‍යා අංශය
- තොරතුරු තාක්ෂණ අංශය
- පරිපාලන, මූල්‍ය හා මානව සම්පත් අංශය

KITSUNE 6U නැනෝ චන්ද්‍රිකාව

අභ්‍යවකාශ තාක්ෂණ අංශයේ ධාරිතා සංවර්ධනය සඳහා ජාතික වශයෙන් වගකිව යුතු ආයතනය ලෙස ACCIMT කියුෂු තාක්ෂණ ආයතනය (Kyutech) සමග දැනට සිදුකර ගෙනයන සහයෝගීතාවන් වන KITSUNE යන ඒකක 6ක නැනෝ චන්ද්‍රිකාව නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම සහ මෙහෙයුම් කිරීමේ වැඩසටහන අඛණ්ඩව සිදුකරනු ලැබීය. මෙම නැනෝ චන්ද්‍රිකාව එහි ඇතුලත් පර්යේෂණ පහසුකම්වලට අමතරව දුරස්ථ සංවේදනය පිළිබඳ සැලකිය යුතු හැකියාවන්ගෙන් සමන්විතවේ. තමාගේම චන්ද්‍රිකාවක් නිර්මාණය කිරීමේ ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයේ වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරමින් මෙම නැනෝ චන්ද්‍රිකාව 2021 වසරේ දෙසැම්බර් මස දියත් කිරීමට සැලසුම්කර තිබුණි. තවද, හවුල්කාර පාර්ශවය ලෙස ACCIMT ආයතනය චන්ද්‍රිකාව කක්ෂගත කළවිට ශ්‍රී ලංකාවට එමගින් ජනනයවන සියලු පෘථිවි නිරීක්ෂණ ඡායාරූප හා වෙනත් පර්යේෂණ දත්ත නොමිලේ ලබාගැනීමට හැකිවේ.

KITSUNE චන්ද්‍රිකාවට 5m විභේදනයක් සහිත පෘථිවි නිරීක්ෂණ, චන්ද්‍රිකා පදනම් IOT, අයන ගෝලීය සංවේදනය, වේගවත් සන්නිවේදනය සහ ප්‍රමිතිගත කියුබ් සැට් බස් යන අංග පහ අයත්වේ. Kyutech හා ACCIMT ආයතනයන්ට අමතරව නැන්යැන් තාක්ෂණ විශ්වවිද්‍යාලය (සිංගප්පූරුව), හරහා සිටි ඉන්කෝපරේෂන් හා අඩිනික්ස් ඉන්කෝපරේෂන් (ජපානයේ කාර්මික හවුල්කරුවන් දෙදෙනා) මෙම ව්‍යාපෘතිය සඳහා හවුල්කාර පාර්ශවවේ.

හවුල්කරුවකු වශයෙන් ACCIMT ආයතනයට පුළුල් පරාසයක දුරස්ථ සංවේදන යෙදවුම් සඳහා භාවිතා කළ හැකි 5m විභේදනයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප සහ දුරස්ථ ස්ථානවල (අභයභූමි, ජල විදුලි බලාගාර ජලපෝෂක ප්‍රදේශ) හෝ ජංගම කාලගුණ මධ්‍යස්ථානවල ජල මට්ටම, කාලගුණික හෝ පාරිසරික දත්ත ඒක්රැස් කිරීම සඳහා භාවිතා කළ හැකි එහි ඇතුලත් “store & forward” සඳහා ප්‍රවේශවීමේ හා චන්ද්‍රිකා සන්නිවේදන ජාලය හරහා අදාල දත්ත පාර්ශවකරුට අවශ්‍ය ස්ථානයට හුවමාරු කිරීමේ හැකියාව ඇත. භෞමික මෙහෙයුම් හා සන්නිවේදනය සඳහා දුරස්ථ ස්ථානයක සිට වෙනම GSTs (භෞමික සංවේදී පර්යන්ත) මෙහෙයුම් කළ යුතුය.

2020 වසර අවසානය වනවිට චන්ද්‍රිකාව නිර්මාණය කිරීම, වැඩිදුයුණු කිරීම, පරීක්ෂා කිරීමේ අදියරවල PDR (මූලික සැලසුම් සමාලෝචනය) සහ CDR (වැදගත් සැලසුම් සමාලෝචනය) නිමකර ඇති අතර දැන් කක්ෂගත කිරීමේ මොඩලය වැඩිදියුණු කිරීම සිදුකෙරේ.





යුරෝපීය රටවල් සඳහා අපරාධ වලට එරෙහි පුද්ගල ආරක්ෂක/ අනතුරු ඇගවීමේ උපකරණය

ස්කැන්ඩිනේවියානු රටවල නිවසින් බැහැර පරිසරයේදී කාන්තාවන්ට එරෙහි අපරාධ වැලැක්වීමට උපකාරීවීම සඳහා වන උසස් ඉලෙක්ට්‍රොනික පදනම් පුද්ගල ආරක්ෂක උපකරණයකි.

මෙම ව්‍යාපෘතිය ස්කැන්ඩිනේවියානු රටවල නිවසින් බැහැර පරිසරයේදී කාන්තාවන්ට එරෙහි අපරාධ වැලැක්වීමට උපකාරීවීම සඳහා උසස් තාක්ෂණික, ක්ෂුද්‍රරූපී උසස් ඉලෙක්ට්‍රොනික උපකරණයක් නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහාවේ. අපගේ ගනුදෙනුකරු වන්නේ ගෝලීය සේවාදායකයින් සඳහා අපනයනය ඉලක්ක කරගත් ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන/උප එකලස් කිරීමේ කර්මාන්තයේ නියලි ආයතනයකි. යෝජිත නිෂ්පාදනය මගින් විශේෂයෙන්ම යුරෝපීය වෙළඳපල ඉලක්ක කෙරේ. සම්පූර්ණ විසඳුම LED තීරුවක් සහිත ඉනපටියක්, අතේ තබාගනු ලබන අනතුරු ඇගවීමේ උපකරණය හා ස්මාර්ට් ජංගම දුරකථනයක් යන කොටස් තුනෙන් සමන්විතවේ. මින් කොටස් දෙකක් එනම් LED තීරුවක් සහිත ඉනපටිය හා අතේ තබාගනු ලබන අනතුරු ඇගවීමේ උපකරණය ACCIMT විසින් නිර්මාණය හා වැඩිදියුණු කළ යුතුව ඇත.









ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ K8 පුහුනු ගුවන් යානාවල ගුවන් ගමන් පාලන උපාංග යථා තත්වයට පත්කිරීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සටන් ගුවන් යානා නියමුවන් පුහුණු කිරීම සඳහා භාවිතා කරන චීනයේ නිෂ්පාදිත K8 ගුවන්යානාවන්හි ගුවන් ගමන් පාලන ඒකකයන්හි දෝෂ හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉල්ලීම පරිදි ACCIMT හි විශේෂ පරීක්ෂා කිරීමේ මෘදුකාංගයක් (test jigs - to counter with the obstacle of the technology becoming obsolete) වැඩිදියුණු කිරීමෙන් පසුව මෙම ඒකක පිළිසකර කිරීමට හැකිවිය.



පරීක්ෂා කිරීමේ මෙවලම මගින් ගුවන් යානා දෙකෙහි දෝෂ සහිත ගමන් පාලන උපකරණය සඳහා මෘදුකාංග වැඩසටහන ලබාගැනීමට භාවිත කරනු ලැබීය. පිළිසකර කළ මෘදුකාංගය K8 ගුවන්යානාවල අනාගත භාවිතය සඳහා ද ලබාගත හැකිවේ. සන්සන්දනාත්මකව වැඩි පිරිවැයකට සැපයුම්කරුගෙන් සේවාව ලබාගැනීමෙන් වැළකී මෙම කාර්යය සාර්ථකව නිමකර ගැනීම මගින් රටට මූල්‍යමය වාසියක් අත්විය.

දේශගුණය අධීක්ෂණය සඳහා ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථානය

ACCIMT විසින් "තේ වගා අංශයේ අවශ්‍යතා සඳහා ධාරිතා ගොඩනැගීම සහ තාක්ෂණික ප්‍රවේශයන්" යන නියමු ව්‍යාපෘතියේ අංගයක් ලෙස ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන (AWS) අටක් සාර්ථකව සැලසුම්කර, වැඩිදියුණුකර, ස්ථාපනයකර, ක්‍රියාත්මක කර තිබේ.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, ACCIMT විසින් වැඩිදියුණු කරන ලද පද්ධතිවල ප්‍රතිලාභියාවූ අතර එක්සත් රාජධානියේ Ethical Tea Partnership මගින් ලද රු.මිලියන 3 ක මූල්‍ය සහය මේ සඳහා ලබාදෙන ලදී.



Portable Monitor System

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ තේ වතු ප්‍රදේශයන්හි කාලගුණය අධීක්ෂණය, ආදර්ශය හා කලින් නිගමනය කිරීම හා කාබන් වායුව, නයිට්‍රස් වායුව, පසේ තෙතමනය හා පසේ උෂ්ණත්වයට එරෙහිව තේ ශාකයේ වර්ධනය අධීක්ෂණය කිරීමවේ.

ACCIMT විසින් වැඩිදියුණු කරන ලද ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථානයේ (AWS) ලක්ෂණ,

ඝර්ම කලාපීය ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන පමණක් අධීක්ෂණය

- වර්ෂාපතනය, වායු උෂ්ණත්වය, ආද්‍රතාවය, සුළඟේ දිශාව හා සුළඟේ වේගය

ඉහත පරාමිතීන්ට අමතරව ACCIMT විසින් වැඩිදියුණු කළ AWS මගින් පහත සඳහන් ලක්ෂණද අධීක්ෂණය කරනු ලැබේ.

- UV මට්ටම, ආලෝකයේ මට්ටම, පාංශු උෂ්ණත්වය සහ වාතයේ ඇමෝනියා මට්ටම

තවද, මෙය පහත දැක්වෙන වායුන්ගේ සංයුතිය විශ්ලේෂණය කිරීම සඳහා වන එහා මෙහා ගෙනයා හැකි විශේෂ ඒකකයකින්ද සමන්විතය.

- කාබන් ඩයොක්සයිඩ්, NOx, ඇමෝනියා (NH3), කාබන් මොනොක්සයිඩ්



Bogawantalawa Fettereso Tea Factory



TRI Tea Estate Kottawa Galle



Tea Research Institute Thalawakele

5. පර්යේෂණ වැඩසටහන් හා තාක්ෂණ සේවා

5.1. කර්මාන්ත අංශය සඳහා ආරම්භ කර ඇති ඉංජිනේරු/තොරතුරු තාක්ෂණ අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්

දුම්රිය එන්ජින් වල ක්ෂුද්‍ර සකසන පදනම් උප පද්ධති වල දෝෂ හඳුනාගැනීම හා උසස් දෘඩකාංග යථාතත්වයට පත් කිරීම (ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව - Class S9 දුම්රිය එන්ජින්)

සංකීර්ණ දුම්රිය ඇන්ජින් පිළිසකර කිරීමේ ප්‍රතිවර්ත ඉංජිනේරු තාක්ෂණය යොදාගැනීම සඳහා ACCIMT ආයතනය හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව අතර දැනට ක්‍රියාත්මක තාක්ෂණ සහයෝගීතා වැඩසටහනෙහි අංගයක් ලෙස, සළකා බලන වසර තුල Class S9 දුම්රිය එන්ජින් දෙකක රියදුරුට දර්ශනය වන පාලන පුවරු (Driver Display sub systems) සාර්ථක ලෙස යථා තත්වයට පත්කර, පරීක්ෂාකර තහවුරු කරගනු ලැබීය.





බැටරි පරීක්ෂා කිරීම සඳහා ධාරිතා ටෙස්ටරය වැඩිදියුණු කිරීම

මෝටර් සයිකල් හා වාහන බැටරි පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ අංග සම්පූර්ණ පරීක්ෂා කිරීමේ පහසුකමක් ඉදිකිරීමේ කාර්යයයේ නියළී සිටින ප්‍රමුඛ පෙලේ බැටරි නිෂ්පාදන හා අපනයන සමාගමක් සඳහා SLS ප්‍රමිතියට අනුව මෝටර් සයිකල් හා වාහන බැටරි සඳහා ධාරිතා ටෙස්ටරයක් (C10 and C20) සැලසුම් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතියකි. ව්‍යාපෘතිය වසරේ අවසන් භාගයේදි ආරම්භකරන ලද අතර ටෙස්ටරයේ පිරිවිතර සැකසීම නිමකර ඇත.



5.2. ඉංජිනේරු/තොරතුරු තාක්ෂණ අංශයේ ආයතනික පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති

නැනෝ චන්ද්‍රිකා වැඩිදියුණු කිරීම හා තාක්ෂණය ලබාගැනීම

ශ්‍රී ලංකාවේ අභ්‍යවකාශ තාක්ෂණ (හෝ අභ්‍යවකාශ ඉංජිනේරු විද්‍යා) ක්ෂේත්‍රයේ නියුතු එකම ආයතනය වන ACCIMT ආයතනය, විද්‍යා හා තාක්ෂණ අංශයේ ප්‍රතිපත්ති ලේඛණ හරහා මේ පිළිබඳ ආයතනයේ මැදිහත්වීම හඳුනාගෙන තිබේ. ආයතනය පසුගිය වසර තුන තුළ ක්‍රියාකාරී ලෙස මෙම ක්ෂේත්‍රයට අවතීර්ණවී සිටින අතර එක්සත් ජාතීන්ගේ අභ්‍යවකාශ තාක්ෂණය හා සම්බන්ධ ක්‍රියාකාරී සැසි හා ජපානය, ඉන්දියාව හා රුසියාවේ අදාල ආයතනවල සහය ඇතිව ඉංජිනේරුවන් සඳහා වන මූලික ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගිවීම ඇතුලු ජාත්‍යන්තර සහයෝගීතාවන් කීපයක්ම ආරම්භ කර ඇත.

2019 වසරේදි රාවණා-1 දියත් කිරීමේ සිට එය සාර්ථකව මෙහෙයුම් කිරීම හරහා ශ්‍රී ලංකා ඉතිහාසයේ නැනෝ චන්ද්‍රිකා පිළිබඳ සාර්ථකත්වය අත්කරගෙන ඇත. මෙම ව්‍යාපෘතිය මගින් අපගේ ඉංජිනේරුවන්ට අනාගත යෙදවුම් වැඩිදියුණු කිරීම මෙන්ම වඩාත් උසස් චන්ද්‍රිකා වැඩිදියුණු කිරීම සඳහා ජපානයේ කියුෂු තාක්ෂණ ආයතනය හා JAXA සමග සහයෝගීතාවය ඇතිකර ගැනීමේ අවස්ථාව උදාවිය. රාවණා-1 දෙවන වසරටත් සාර්ථකව මෙහෙයුම් කෙරෙන අතර එමගින් පර්යේෂණ දත්ත ලබාගැනීමේ හැකිවී තිබේ. ACCIMT හි ස්ථාපිත භෞමික මධ්‍යස්ථානය මගින් නිරන්තරව කැමරා ඡායාරූප භාගත කරනු ලැබේ.





Xilinx FPGA තාක්ෂණය පදනම් වූ තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය

මෙම යෝජිත පද්ධතිය නිෂ්පාදන ක්‍රියාවලියේ අවසන් අදියරේදී පහතරට තේ සකස් කිරීම සඳහා යෝග්‍යවේ. මෙම වැදගත් ආදේශකය නිමකළ විට නුදුරු අනාගතයේදී තේ කර්මාන්ත ශාලාවකදී පරීක්ෂාකර බලනු ඇත. දැනට පද්ධතියේ තුන්වන අදියර සම්පූර්ණකර ඇති අතර තේ සාම්පල යොදාගෙන පර්යේෂණාගාරයක් තුළදී පරීක්ෂා කිරීම් සිදුකර ඇත.



මේ වනවිට පද්ධතියේ තෙවන අදියර නිමකර ඇති අතර තත්‍ය තේ සාම්පල යොදාගෙන පරික්ෂණාගාර පරිසරයක් තුළ පරීක්ෂා කිරීම් සිදුකෙරේ. මෙම පද්ධතිය තේ කොළ පටවන බඳුන්, කම්පකයක් (තේ කොළ සමානව බෙදාහැරීමට), තේ කොළ රැගෙනයන මග හා එකතු කිරීමේ බඳුන් යන යාන්ත්‍රික උප ඒකක වලින් හා Xilinx FPGA තාක්ෂණය පදනම් වූ අධිවේගී ඡායාරූප සැකසීමේ (කැමරා පදනම්) හා අංශු නික්ෂේපණය කිරීමේ යාන්ත්‍රණයකින් සමන්විතවේ.

ව්‍යාපෘතියේ IV වන අදියර ආරම්භකර ඇති අතර අවශ්‍ය උපාංග මිලදී ගැනීමේ කාර්යයන් සිදුකෙරෙමින් පවතී. යෝජිත පද්ධතිය නිෂ්පාදන ක්‍රියාවලියේ අවසන් පියවරේදි පහත රට තේ සැකසීම සඳහා යෝග්‍යවේ. මෙම අපනයන ආදේශක ප්‍රයත්නය නිම කිරීමෙන් අනතුරුව නුදුරු අනාගතයේදී තේ කර්මාන්තශාලාවකදී පරීක්ෂාකර බලනු ලැබේ.



තේ කර්මාන්ත ශාලාවේ අවසන් සකස් කිරීම සිදුවන ස්ථානයේදී තේ අංශුවල වර්ණය හා ප්‍රමාණය අනුව තත්වය ශ්‍රේණිගත කිරීම සඳහා චීනය, ජපානය හෝ කොරියාව යන රටවල් වලින් ආනයනය කළයුතු ඉතා මිල අධික යන්ත්‍ර භාවිතා කිරීමට සිදුවීම නිසා කර්මාන්තශාලා හිමිකරුවන්ට ඉතා ඉහල අයෝජනයක් සිදුකිරීමට සිදුවේ. සාමාන්‍ය කර්මාන්ත ශාලාවක් සඳහා මෙම ක්‍රියාවලිය බහුවිධ යන්ත්‍ර සමගින් වේගයෙන් සිදුකළ යුතුවේ. නැතහොත් ශ්‍රී ලංකාවේ පහතරට හා මධ්‍යම ප්‍රදේශයේ තේ කර්මාන්ත ශාලාවල දෛනික තේ සැකසීමේ ක්‍රියාවලියේදී අවහිරතා (bottleneck) ඇතිවේ. පුලුල් පරාසයක තේ අංශු වෙන්කිරීම සඳහා තීරණ ගැනීමේ ඉලෙක්ට්‍රොනික උපාංග සහිත ඉතා උසස් තාක්ෂණයෙන් හා වේගයෙන් ක්‍රියාකරන මෙබඳු යන්ත්‍රයක් නිපදවීම ශ්‍රී ලංකාවට අභියෝගාත්මක කාර්යයක් වේ. නමුත් වසර දහයකට වතාවක් යන්ත්‍ර සඳහා ආයෝජනය කිරීම සහ දිනපතා යන්ත්‍ර නඩත්තු කිරීම සැලකූවිට ශ්‍රී ලංකාවේ වත්මන් හා අනාගත අවශ්‍යතා සඳහා මෙය විශාල අවස්ථාවක්වේ.

මෙම පර්යේෂණ හා සංවර්ධන කාර්යය සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යයන සිදුකිරීමෙන් අනතුරුව තාක්ෂණ හැකියාවන් එකතු කරන අතරම ’ක්‍ෂඵඔ ආයතනය ඉතා හොඳ තත්වයේ යන්ත්‍රයක් නිපදවීම ආරම්භ කරනු ලැබීය. නිෂ්පාදන ක්‍රියාවලියේදී සාම්පල පරීක්ෂා කිරීම් සිදු කරන

අතරතුර කැමරා තෝරාගැනීමේදී, වේගවත් සකසන (FPGA families) තෝරාගැනීමේදී,කාර්මික පද්ධතිය සෑදීමේදී සහ නවීකරණයන් සිදුකිරීමේදී සාර්ථක හා අසාර්ථකත්වයන් සහිත තාක්ෂණික ක්‍රම කිපයක් අනුගමනය කළයුතු විය. 2020 වසරේදී ව්‍යාපෘතියේ අවසන් අදියර වන 4වන අදියර ආරම්භ කරනු ලැබීය.

ACCIMT විසින් වැඩිදියුණු කරන ලද ඩ්‍රෝන යානා විශේෂ යෙදවුම් සඳහා යොදාගැනීම

සාමාන්‍ය ප්‍රමාණයක බරක් රැගෙනයා හැකි ඩ්‍රෝන යානා නිපදවීමෙන් පසුව වඩාත් උසස් යෙදවුම් ඉලක්ක කර තවදුරටත් කටයුතු කරනු ලැබීය. මෙසේ නිපදවන ලද පද්ධති RGB කැමරා මගින් ද ශාකමය ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා බහුවර්ණාවලීක්ෂ කැමරා මගින් ද පරීක්ෂා කරනු ලැබීය. එසේම ඒවා ජායාරේඛනමිතිය, ඩිජිටල් උන්නතාංශ මොඩල, එකිනෙක සම්බන්ධකරන ඩ්‍රෝන සිතියම් හා භූමියේ ත්‍රිමාන මොඩල (සමතලා බිම්, තේ වතු, කුඹුරු, තෙත් බිම්) යන යෙදවුම් සඳහා සාර්ථකව පරීක්ෂාකර ඇත.

ACCIMT විසින් වායුඅභ්‍යවකාශ විද්‍යාගාරයේ ඉංජිනේරුවන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා, කර්මාන්ත මගින් ඉල්ලීම් කරනු ලැබූ යෙදවුම් කාර්යයන් සඳහා මෙන්ම ගනුදෙනුකරුවන්ට ප්‍රදර්ශනය කිරීම සඳහා ඩ්‍රෝන මොඩල කිපයක් සැලසුම්කර වැඩිදියුණු කරනු ලැබීය. ප්‍රධාන යෙදවුම් වන්නේ ආවේක්ෂණය හා සිතියම්ගත කිරීමවේ. RGB කැමරා හා බහුවර්ණාවලීක්ෂ කැමරා යානාවේ රැගෙන යන උපකරණවේ. ජායාරේඛනමිතිය, වගාබිම් හඳුනා ගැනීම, ඩිජිටල් උන්නතාංශ මොඩල, ඉහළ විභේදනයක් සහිත ජායාරූප සහ භූමියේ ත්‍රිමාන මොඩල සඳහා මෙම පද්ධති සාර්ථක ලෙස යොදාගනු ලැබීය. වසර තුළ මෙම ඩ්‍රෝන මොඩල අදාල යෙදවුම්, නියමු ව්‍යාපෘති සඳහා සාර්ථක ලෙස යොදාගනු ලැබූ අතර ප්‍රදර්ශනය කිරීම් සිදුකරනු ලැබීය.

ACCIMT ආයතනය විසින් නිපදවන ලද ජල රෝධි භ්‍රමණතල හතරක යානය (කාබන් කෙඳි) යොදාගැනීම

2019 වසරේ සැලසුම්කර නිපදවා පරීක්ෂාකර බලනු ලැබූ මෙම ඩ්‍රෝන යානය තේ ඉඩම් සිතියම්ගත කිරීම (භූමිය, උන්නතාංශ, ඉහළ විභේදනයක් සහිත ජායාරූප ආදී), එහි රැගෙනයන බහුවර්ණාවලීක්ෂ කැමරා මගින් ගුවනේ සිට ලබාගත ජායාරූප මගින් වතුවල විවිධ වගා මට්ටම් හඳුනා ගැනීම වැනි තේ කර්මාන්ත අංශයේ යෙදවුම් සඳහා සාර්ථක ලෙස යොදාගනු ලැබීය. තලවකැලේ (ශාන්ත කුම්බිස් වත්ත) හා කලවාන (සෙලිලියන් වත්ත) ඉලක්කගත ප්‍රදේශවේ. නිවරදි කෘෂිකාර්මික තාක්ෂණ භාවිතය සඳහා තේ කර්මාන්ත අංශය උනන්දු කරවීම සඳහා අධ්‍යයනයේ ප්‍රතිපල ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයට ඉදිරිපත්කර ඇත. ජායාරූප මගින් ලබාගත් අධ්‍යයනයේ ප්‍රතිපල හෝ පුරෝකථන භූමියේ සත්‍ය දත්ත සමග සසඳා බැලිය යුතු අතර තේ පර්යේෂණ ආයතනය සමග යෝජිත අවබෝධතා ගිවිසුම (MOU) අත්සන් කලවිට තවදුරටත් පර්යේෂණ සිදුකළ යුතුය.







විදුරු කෙඳි. VTOL හා ටේල් සිටර් VTOL UAVs (EPP ෆෝම්) පරීක්ෂා කිරීම

ආයතනය භ්‍රමණ මෝටර් දෙකක් යොදාගෙන සිරස්ව ගුවන්ගත කරන හා ගොඩබාන (VTOL) UAV යානා නිර්මාණය හා වැඩිදියුණු කිරීම ආරම්භ කරනු ලැබිය. බහු භ්‍රමණ තල (කුඩා භූමි ප්‍රදේශයකදී ගුවන්ගත කිරීම හා ගොඩබෑම) තිබීම හා ආවරණ ප්‍රදේශය වැඩිවීම යෝජිත UAVහි වාසි වේ. සමාලෝචනයට ලක්වන වසර තුල සම්පූර්ණයෙන්ම ACCIMT ආයතනයේ නිර්මාණයක් ලෙස මෙම තාක්ෂණික නවෝත්පාදනය සම්පූර්ණකරන ලදී. යානා පරීක්ෂා කිරීම සාර්ථකව සිදුකර ඇති අතර ස්ථායිතාව වැඩිදියුණු කිරීම හා සංක්‍රමණ (සිරස් හා තිරස්) ඇල්ගොරිදම සකස්කරනු ලැබීය.

වෙරළබඩ ප්‍රදේශයන්හි ආවේක්ෂණ සඳහා VTOL UAVs භාවිතා කිරීමේ හැකියාව සොයාබැලීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව සමග සාකච්ඡා සිදු කෙරේ. ව්‍යාපෘතියේ ශක්‍යතාව අධ්‍යයනය කිරීමේ මූලික පියවරක් ලෙස ප්‍රදර්ශන කළහැකි යානයක් නිර්මාණයකර, වැඩිදියුණුකර පරීක්ෂාකරනු ලැබීය. ACCIMT ආයතනය විසින් වැඩිදියුණු කරන ලද පුහුණු ඩ්‍රෝන යානා යොදාගෙන ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා සකස්කළ යුතු පුහුණු වැඩසටහන් සඳහා අරමුදල් ලබාගැනීමට අරමුදල් සපයන ආයතනයට යෝජනාවක් ඉදිරිපත් කර ඇත.





පූර්ව දැනුම්දිය හැකි නඩත්තු ඒකකයක් (PdM) හරහා පද්ධති වැඩිදියුණු කිරීම සඳහා අඩු වියදම් විසඳුමක්

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ පූර්ව දැනුම්දීමේ නඩත්තු සංකල්පය භාවිතයෙන් යන්ත්‍රවල දෝෂ ඇතිවීමට පෙර ඒවා හඳුනා ගැනීම සඳහා දෝෂ හඳුනා ගැනීමේ පද්ධති විඩම්බකයක් නිර්මාණය කිරීමයි. යන්ත්‍රයක පවත්නා තත්වය ආවර්තිතව අධීක්ෂණය කිරීම මගින් මෙම කාර්යය ඉටුකර ගැනීමට අපේක්ෂිතය.



මූලික විඩම්බකය නිර්මාණය කිරීම, එනම් ව්‍යාපාතියේ පළමු අදියර නිමකර ඇත. SOLIDWORKS මෘදුකාංගය යොදාගෙන මෙම විඩම්බකය නිර්මාණය කර ඇත. මෙම විඩම්බකය සමග විවිධ දෝෂ වලට අදාල දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමට හා පූර්ව දැනුම්දීමේ නඩත්තු සංකල්පය (PdM) භාවිතයෙන් යන්ත්‍ර පද්ධති ඇතුලත ඇතිවන දෝෂ ඒවා ඇතිවීමට පෙර හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ.

පූර්ව දැනුම්දීමේ නඩත්තු සංකල්පය පිළිබඳ උපදේශන ආරම්භ කිරීම සඳහා ආයතනය තුළ ධාරිතාවන් සංවර්ධනය කිරීමට හා ඊට උපකාරීවන දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමටද අපේක්ෂා කෙරේ.

වැඩිදියුණු කරන ලද දෝෂ විඩම්භකයක් භාවිතයෙන් සැබෑ ලෝකයේදී එවන් දෝෂ ඇතිවීම වැඩිකර පාලනය කිරීමේ පරීක්ෂණ හරහා විවිධ කම්පන සටහන් පිලිබඳව අවබෝධයක් ලබාගැනීම දෙවන අදියරේ අරමුණවේ. මෙමගින් ඉතා සාර්ථක දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමට හැකිවේ.

මෙම අදියර දෙක මගින් ප්‍රධාන මෙවලම ලෙස කම්පන විශ්ලේෂණය යොදාගැනෙන පූර්ව දැනුම් දීමේ නඩත්තු මධ්‍යස්ථානයක් පිහිටුවීමේ අවසන් ඉලක්ක ලඟාකර ගැනීම සඳහා සහයක කාර්යයන් සිදුකෙරේ.

ජංගම දුරකථන පදනම් කරගත් ECG සටහන් විශ්ලේෂකයක් සැලසුම් කිරීම හා නිපදවීම

මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ටෙලිමෙඩිසින් හා පෙව් තොරතුරු බලාත්මක කිරීම සඳහා තාක්ෂණික පසුබිමක් සැපයීමට ECG දත්ත ලබාගැනීම, ගබඩා කිරීම, සම්ප්‍රේෂණය හා විශ්ලේෂණය කිරීමේ හැකියාව ඇති ස්මාට් දුරකථන මගින් ක්‍රියාත්මක ECG සටහන් විශ්ලේෂකයක් නිපදවීම අරමුණු කෙරේ. මූලික අධ්‍යයනය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මූලාකෘති නිර්මාණය කිරීම සඳහා පර්යේෂණාගාර පරීක්ෂණ සිදුකෙරෙමින් පවතින අතර ඊට අමතරව මේ වන විට ඇන්ඩ්‍රොයිඩ් තාක්ෂණය මත පදනම් වූ ජංගම දුරකථන යෙදවුමක් වැඩිදියුණු කර ඇත.







Mobile App Developed **Testing**

පොලි ටනල සඳහා උෂ්ණත්වය අධීක්ෂණය/පාලනය කිරීමේ පද්ධතිය

අහිතකර කාලගුණික තත්වයන්ට මුහුණදීම පිණිස කලාපයේ නිරසාර බෝග නිෂ්පාදනය සඳහා පහසුකම් සැලසීමට පොලි ටනල තුළ ස්ථාවර උෂ්ණත්වය පරාසයක් අධීක්ෂණය කිරීම හා පවත්වා ගැනීම සඳහා නවීන, ශක්‍ය හා පිරිවැය ඵලදායි තාක්ෂණයක් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණවේ.

මෙහි නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ස්ථානය ලෙස නාරම්මල බිම්මල් ගොවිපලක් හඳුනාගෙන තිබේ. මේ වනවිට එම ස්ථානයේ උෂ්ණත්ව පාලන පද්ධතියක් ස්ථාපනය කර ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකෙරේ.





විදුලි සැර වලින් ආරක්ෂාවීම සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම

විදුලිසැර වැදීම වලින් සිදුවන හානි හා පාඩු අඩුකිරීම, ආරක්ෂාව ප්‍රමිතිකරණය හා මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන වැඩිදියුණු කිරීම, දැනුම බෙදාහැරීම, උපදේශන සේවා හා ප්‍රතිපත්තිමය නිර්දේශ සැපයීම අරමුණු කරගෙන ආයතනය විසින් විදුලිසැර වලින් ආරක්ෂාවීම සඳහා විදුලි සැර වලින් ආරක්ෂාවීමේ අංග සම්පූර්ණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ කාර්යයන් ආරම්භකර එම කාර්යයන් හොඳින් සිදුකරගෙන යනු ලැබේ. මෙම වසර තුල සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා පොලිසිය, රෝහල්, විශේෂ කාර්ය බලකාය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන හා වැවිලි අංශය වැනි රාජ්‍ය ආයතන ගණනාවක් සඳහා උපදේශන හා පරීක්ෂා කිරීමේ සේවාවන් කීපයක්ම සපයනු ලැබිය.





තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති

ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් විශේෂිත ඉල්ලීම් වලට අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා තොරතුරු පද්ධති විසඳුම් වැඩිදියුණු කිරීම් සිදුකර ඇත.

තොරතුරු තාක්ෂණ (IT) විසඳුම් වැඩිදියුණු කිරීම

දේශගුණික අධීක්ෂණය සඳහා ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන සඳහා වෙබ් අතුරු මුහුණතක් වැඩිදියුණු කිරීම

ආයතතනය විසින් නිපදවනු ලැබූ දේශගුණය අධීක්ෂණය සඳහා ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන සඳහා මෘදුකාංග මොඩියුලයක් ලෙස වෙබ් පාදක අතුරු මුහුණතක් වැඩිදියුණු කිරීම තොරතුරු තාක්ෂණ අංශය මගින් සිදුකරනු ලැබිය. එකතුකරන ලද සංවේදක දත්ත දර්ශනය වීම සහ ඒවා ප්‍රස්ථාරමය ලෙස ඉදිරිපත් කිරීම සහ පර්යේෂණ කාර්යයන් සඳහා දළ දත්ත බාගත කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා මෙම අතුරු මුහුණත මගින් පහසුකම් සැලසේ. තවද, ACCIMT ආයතනය විසින් වැඩිදියුණු කරන ලද මෙම මෘදුකාංග මොඩියුලය මගින් විශේෂිත පරිශීලක අවශ්‍යතා පදනම් කරගෙන තෝරාගත් දත්ත කට්ටල බාගත කිරීම, ප්‍රදර්ශනය කිරීම හා විශ්ලේෂණය කිරීමේ හැකියාව ඇත.



ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන මගින් එක්රැස්කරන ලද දත්තවල ප්‍රස්තාරමය ඉදිරිපත් කිරීම



වැඩිදුර විශ්ලේෂණය හෝ වෙනත් පර්යේෂණ කාර්යයන් සඳහා දත්ත බාගත කිරීම සඳහා වැඩිදියුණු කරන ලද අතුරු මුහුණත

ජංගම දුරකථන යෙදවුම් (Mobile Apps) වැඩිදියුණු කිරීම

තොරතුරු තාක්ෂණ අංශය විසින් 2020 වසර තුළ "INNOTECH 2020" ප්‍රදර්ශනය මෙන්ම "කොවිඩ්-19 අනුකූලතා අධීක්ෂණ" කාර්යයන් සඳහා පහසුකම් සැලසීමට ජංගම දුරකථන යෙදවුම් දෙකක් වැඩිදියුණු කරනු ලැබීය. සේවාදායකයා විසින් ඉල්ලා සිටිනු ලැබූ සියලු විශේෂ ලක්ෂණ මෙම යෙදවුම් වලට ඇතුලත්කර ඇත.



INNOTECH 2020 ප්‍රදර්ශනය සඳහා වැඩිදියුණු කරන ලද ජංගම දුරකථන යෙදවුම

ගිවිසුම්ගත සේවාවන්

2020 වසරේදී සිදුකරනු ලැබූ දත්ත ගබඩා හා වෙනත් තොරතුරු පද්ධති ගිවිසුම්ගත නඩත්තු කිරීම්

- ගිණුම් පද්ධතිය - මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය.

- වැටුප් පද්ධතිය - සංවර්ධන ලොතරැයි මණ්ඩලය

ආයතනික මෘදුකාංග වැඩිදියුණු කිරීම්

ACCIMT ආයතනයේ අභ්‍යන්තර පරිපාලන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා 2020 වසරේදී පහත දැක්වෙන මෘදුකාංග පද්ධති තවදුරටත් වැඩිදියුණු කිරීම හා වෙනස් කිරීම සිදුකරනු ලැබීය.

- ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය
- ක්‍රමාංකන කළමනාකරණ පද්ධතිය
- ව්‍යාපෘති ලියාපදිංචි කිරීමේ පද්ධතිය
- වැටුප් පද්ධතිය
- නිවාඩු හා පැමිණීම සටහන් කිරීමේ පද්ධතිය
- ගිණුම් පද්ධතිය
- ඉන්වොයිස් පද්ධතිය

මීට අමතරව ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අධීක්ෂණය සඳහා නව මොඩියුලයක් ආරම්භකර ඇත. මෙම මොඩියුලය ලබන වසරේදි නිමකරනු ඇත.

ACCIMT LAN, වෙබ් අඩවිය හා අදාල ජාලගත සේවාවන්

ආයතනයේ සියලු සේවකයින් සඳහා අන්තර්ජාල සේවාවන් තහවුරු කිරීම සඳහා ආයතනික LAN, ඊමේල් සර්වරය හා වෙබ් සර්වරය පවත්වාගෙන යනු ලැබීය.

5.3 කොවිඩ්-19 හා අදාල වැඩිදියුණු කිරීම්

LAMP Assay තාක්ෂණය පදනම් කරගත් කොවිඩ්-19 හඳුනා ගැනීමේ උපකරණයක් වැඩිදියුණු කිරීම

2020 වසරේ කොවිඩ් ආරම්භවූ මුල් කාලයේදී භාවිතා කරනු ලැබූ RT-qPCR පදනම් ක්‍රමය සඳහා වැඩි කාලයක් ගතවිය. ප්‍රජාපාදක හඳුනාගැනීම් හා සෞඛ්‍යය සේවා මධ්‍යස්ථානයන්හි එදිනෙදා හඳුනා ගැනීම් සිදුකිරීම සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් මෙන්ම මිල අධික ද්‍රව්‍ය හා උපකරණ අවශ්‍යවේ. මෙම සීමාවන් හේතුවෙන් අවශ්‍ය සියලු පහසුකම් වලින් සමන්විත මධ්‍යගත විද්‍යාගාරයන් හිදී හඳුනා ගැනීමේ පරීක්ෂා කිරීම් වඩා හොඳින් සිදුකෙරේ.

qPCR යන්ත්‍රවල අධික පිරිවැය (ආසන්න වශයෙන් රු. මිලියන 5ක්) හේතුවෙන් රසායනාගාර, රෝහල්, හා සායන බොහොමයකටම මෙම පහසුකම සපයාගත නොහැකිවේ.

එමනිසා රෝගීන්ගේ සාම්පල විවිධ ස්ථානයන්හිදි එකතුකර පරීක්ෂා කිරීම සඳහා රසායනාගාර වෙත යවන අතර මෙමගින් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාදවේ. එමනිසා සාපේක්ෂව අඩු පිරිවැයක් සහිතව ඒ සඳහා පුහුණුවූ කාර්යමණ්ඩලයක් නොමැතිව කෙටි කාලයක් තුළ එම ස්ථානයේදීම කොවිඩ්-19 හඳුනාගැනීම සඳහා භාවිතාකළ හැකි ඉලෙක්ට්‍රොනික උපකරණයකින් හා පෙවරසායනික පරීක්ෂණ කට්ටලයකින් සමන්විත LAMP විශ්ලේෂණය පදනම් කොවිඩ්-19 හඳුනා ගැනීමේ උපකරණයක් වැඩිදියුණු කිරීම සුවිශේෂ වාසියක්වේ.







රෝහල් වලට කොවිඩ්-19 පරීක්ෂණ සඳහා පෙව සාම්පල ලබාගැනීම සඳහා ආරක්ෂිත කුටි හයක් ලබාදීම මගින් ආයතනික සමාජීය වගකීම ඉටුකිරීම

කොවිඩ්-19 රෝගීන් සඳහා ප්‍රතිකාර කරන ප්‍රධාන රෝහල් මගින් ලද ඉල්ලීම් ගණනාවක් වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය. මේ සඳහා උසස් තාක්ෂණයක් යොදා නොගත්තද පරීක්ෂා කිරීම් සඳහා රෝගීන්ගේ ශ්වසන සම්පල ලබාගැන්මේදී එමගින් වෛද්‍ය වෘත්තිකයින්ට ඉමහත් පිටුවහලක් ලැබුණි. ACCIMT විසින් වැඩිදුයුණු කළ පලමු ඒකකය 2020 අප්‍රේල් 07වන දින සිට IDH රෝහලේ භාවිතා කෙරේ. එතැන් සිට ACCIMT විසින් ශ්‍රී ජයවර්ධනපුර, මුල්ලේරියාව සහ හෝමාගම රෝහල් සඳහා මෙම ඒකක 6ක් සපයාදී ඇති අතර එම ඒකක එකී රෝහල් සඳහා ඉතා ප්‍රයෝජනවත්වත් වී ඇත.





කොවිඩ් -19 අනුකූලතා අධීක්ෂණ පද්ධතිය සඳහා ජංගම දුරකතන යෙදවුමක් වැඩිදියුණු කරනු ලැබීය.

ඉහත සඳහන් ජංගම දුරකතන යෙදවුම හා අදාල වෙබ් අතුරු මුහුණත මගින් සෞඛ්‍යය බලධාරීන්ට කොවිඩ්-19 සෞඛ්‍යය මාර්ගෝපදේශයන්ට අනුකූලව අභ්‍යන්තර ආයතන අධීක්ෂණය කිරීම සඳහා පහසුකම් සැලසේ. කර්මාන්ත ශාලා, කඩ සාප්පු, සේවා මධ්‍යස්ථාන, සුපිරි වෙළඳසැල් ආදී ආයතන පද්ධතිය සඳහා ලියාපදිංචි වන අතර සෞඛ්‍ය බලධාරීන් විසින් අදාල QR කේතය නිකුත් කරනු ඇත. එම ස්ථානයන්ට ගමන් කිරීමේදී ජංගම දුරකතන යෙදවුම භාවිතයෙන් ඔවුන්ගේ සෞඛ්‍යය මාර්ගෝපදේශයන්ට අනුකූලතාව අධීක්ෂණය කෙරෙන අතර පටිගතවේ. පටිගතවූ දත්ත ආධාරයෙන් මහජන සෞඛ්‍යය පරීක්ෂක, සෞඛ්‍යය වෛද්‍ය නිලධාරී සහ දිස්ත්‍රික් සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂ යන සෞඛ්‍යය බලධාරීන්ට එක් එක් ආයතනයේ තත්වය අධීක්ෂණය කිරීම හෝ සැසඳීම, වාර්තා සකස් කිරීම හා තත්වය විශ්ලේෂණය කිරීමට හා ඒ අනුව තීරණයන්ට එලඹීමට හැකිවේ.





5.4 තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති

ද්විත්ව විචල්‍ය තාරකා පිළිබඳ පර්යේෂණය - චීනයේ යුනාන් නිරීක්ෂණාගාරය සමග සහයෝගීතා වැඩසටහන

ද්විත්ව විචල්‍ය තාරකා (CVs) යනු ප්‍රධාන තාරකාව හෝ ක්‍රමයෙන් විකාශය වන තාරකාවකින් ද්‍රව්‍ය වැඩිකර ගන්නා සුදු නිලීන තාරකාවකින් සමන්විත අන්‍යෝන්‍ය ලෙස පවතින ද්විත්ව තාරකා පද්ධතිවේ. මෙම තාරකාවල කක්ෂගත චලනය, පද්ධතියේ පිහිටුම, ද්‍රව්‍ය මාරුවීම, කෝණිය චලන නැතිවීම වැනි මෙම ද්විත්ව තාරකා සම්බන්ධ නොවිසඳි පවතින ප්‍රශ්ණ ගණනාවන් පවතින බැවින් විවිධ ද්විත්ව තාරකාවල ක්‍රමයෙන් වෙනස්වන ලක්ෂණ අධ්‍යයනය කිරීම හා ගවේෂණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණුවේ.

Nova-Like V378 Pegasi යන අධ්‍යයනය සිදුකරන ද්විත්ව තාරකා පද්ධතියේ තාරකා විද්‍යාත්මක දත්ත ලබාගැනීම හා දත්ත අවකරණය සිදුකරනු ලැබීය. මෙම තාරකාව පිළිබඳ ප්‍රකාශමිතික දත්ත විශ්ලේෂණය කරනු ලැබූ අතර “Re-investigation of the periodic modulations in Cataclysmic Variable 'V378 Peg' using WASP data” යන මාතෘකාව යටතේ පර්යේෂණ පත්‍රිකාව ලියන ලදී. පර්යේෂණ පත්‍රිකාව ජාත්‍යන්තර සම-කර්තෘගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරන ලදී.

e-CALLISTO ජාලය සඳහා දිගු තරංග ඇන්ටනා පද්ධතියක් නිර්මාණය කිරීම හා ඉදිකිරීම

සූර්යයා මත ඇතිවන ශක්තිය විහිදුවන සූර්ය ගිනිදැල් සූර්ය නක්ෂත්‍රයේ තවමත් විශාල ලෙස නොදන්නා භෞතික ක්‍රියාවලියකි. පෘථිවිය දෙසට ඇති සූර්ය ගිනිදැල් චන්ද්‍රිකා පද්ධති වලට ඉතා හානිකර වන අතර එමගින් පෘථිවි පද්ධතියට හිතකර නොවන වායුගෝලීය බලපෑමක් ඇතිවේ. සූර්ය ගිනිදැල් පිටවීමේ ක්‍රියාවලිය සඳහා සුදුසු මොඩලයක් සකස් කිරීම සඳහා දිගු කාලීන පදනමින් සූර්ය ගිනිදැල්වල බහු තරංග ආයාම අධ්‍යනයක් සිදුකළ යුතුය. ගිනිදැල් පිටවීමේ මොඩලය සකස් කිරීම සඳහා සූර්ය ගිනිදැල්වල චුම්බක ක්ෂේත්‍ර මිනුම් අත්‍යාවශ්‍යවේ.

දැඩි ලෙස සූර්ය තරංග පිටවීමේ ධ්‍රැවීකරණය මැනීම සඳහා නිරීක්ෂණ පද්ධතියක් නිර්මාණය කළ යුතු අතර එමගින් චුම්බක ක්ෂේත්‍ර ගණනය කළ යුතුය.



සූර්ය ගිනිදැල්වල ධ්‍රැවීකරණ මිනුම් සඳහා දිගු තරංග ඇන්ටනා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වන වැඩසටහනෙහි ප්‍රධාන අන්වේෂක (PI) වන ආචාර්ය ක්‍රිස්ටින් මොන්සිටින්ගේ සහභාගිත්වය ඇතිව වැඩමුලුවක් පැවැත්විණ. 4NEC2 නිර්මාණ මෘදුකාංගය භාවිතයෙන් දිගු තරංග ඇන්ටනාව නිර්මාණය කරනු ලැබීය. ඇන්ටනා කාර්ය ප්‍රශස්තිකරණය සිදුකරනු ලැබීය. සැලසුම් හා වැඩිදියුණු කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඉදිරිපත්කරනු ලැබූ යෝජනාව පිළිගනු ලැබූ අතර සැලසුම් අදියර ආරම්භ කරනු ලැබීය. RF සංරචක හා ඇන්ටනා ඉදිකිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීමට වැඩසටහන් සකස් කරනු ලැබීය. අරමුදල් නොමැතිවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය 2021 වසරට ගෙන යන ලදී.

Proxima Centauri b සහ Ross-128 b යන සෞරග්‍රහ මණ්ඩලයෙන් පිටතින් පිහිටි ආසන්න ග්‍රහලෝකවල අභ්‍යන්තර ව්‍යුහය පිළිබඳ ලක්ෂණ සොයාබැලීම



සෞරග්‍රහ මණ්ඩලයෙන් පිටත පිහිටි ගල් සහිත මෙම ග්‍රහලෝකයේ ව්‍යුහය අධ්‍යයනය සඳහා නව සංඛ්‍යාත්මක මොඩලයක් නිර්මාණය කරන ලද අතර එය ආසන්නව පිහිටි Centauri b හා Ross-128 b යන ග්‍රහලෝක සඳහා අදාල කරගනු ලැබීය. මෑතකදී මනින ලද රතු නිලින කාරකාවල හා Alpha Centauri ගේ මූලද්‍රව්‍ය සුලභතාව මිනුම් සෑම ග්‍රහලෝකයකම ප්‍රමාණාත්මක සංයුතිය සෙවීමට හා ඒවායේ ගර්භයේ ස්කන්ධ බණ්ඩය (CMFs) මිනුම් සඳහා භාවිතා කරනු ලැබීය. අපගේ මොඩලයේ ප්‍රතිපල මගින් Proxima b අරය හා එහි අවම ස්කන්ධය 2M වැනි ඉහළ අගයක් ගන්නේ නම් එම අගය 1.170 ± 0.040 R වන බවත් අනුමාන කළ හැක. Ross-128 b ග්‍රහයාගේ අරය 1.036 ± 0.040 වියහැකි අතර එය ස්කන්ධය 2M වැනි ඉහළ අගයක් නම් එය 1.170 ± 0.040 R වේ. Ross-128 b ග්‍රහයාගේ අවම ස්කන්ධයේදී අරය .034 ± 0.040 R වියහැකි අතර එහි 2M උඩත් පර්යන්තයේ අරය 1.150 ± 0.040 R වේ.

ග්‍රහලෝක දෙකටම පෘථිවියට සමාන තුනී ස්ත්‍රාවරණයක් තිබිය හැකි නමුත් Proxima b හා Ross-128 සඳහා වන CMFs පිළිවෙලින් 20–59 හා 34–59 යන ප්‍රතිශත පරාසයන්හි විය හැකි අතර ඒ අනුව ඒවායේ ගර්භයේ විශාල වශයෙන් යකඩ ඇතිබව අනුමාන කෙරේ. ඒවායේ උෂ්ණත්වය ගර්භය අඩ වශයෙන් ද්‍රවකිරීමට තරම් වැඩි අගයක් ගන්නා අතර චුම්බක ක්ෂේත්‍රයක් ඇති කිරීමටද සමත්විය හැක. ඒවායේ චුම්බක ක්ෂේත්‍රයක් ඇතිනම්, stellar tidal බලපෑම හේතුවෙන් ඇතිවන අඩු භ්‍රමණය නිසා බොහෝවිට බහුධ්‍රැවීය ස්වභාවයක් ඇතිවිය හැකිය. Proxima b හා Ross-128 b චුම්භක ක්ෂේත්‍රයේ අගයන් පිළිවෙලින් 0.06–0.23 G හා0.07–0.14 G වන බවට අනාවැකි පළකරනු ලැබ ඇත. ග්‍රහයන් එකක හෝ ස්කන්ධය වාෂ්පශීලි, චුම්භක ක්ෂේත්‍රයන් වේනම් ඒවා නොපවත්නා අතර ඉතා දුර්වලවේ. ග්‍රහලෝක දෙකෙහිම තත්වය අනුව එහි වාසය කිරීමට සුදුසු පරිසරයක් තිබිය හැකිය.

අගල් 14 මීඩ් දුරදක්නය දුරස්ථව පාලනය කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම

මීඩ් දුරදක්නයේ විධාන කට්ටලය අධ්‍යයනය කරන ලදී. 12" මීඩ් දුරදක්නය සාර්ථක ලෙස පිළිසකර කරනු ලැබිය. ASCOM පාලක හා AudeLA මෘදුකාංගය සාර්ථක ලෙස ස්ථාපනය කරනු ලැබිය. දුරදක්නය අන්තර්ජාලය හරහා පාලනය කිරීම සඳහා වන මූලික පරීක්ෂාවන් සාර්ථක විය. CCD කැමරාව හා දුරස්ථව මෙහෙයුම් කිරීම සඳහා අවශ්‍ය වෙනත් උපාංග ඇණවුම් කරනු ලැබිය.

5.5 දුරස්ථ සංවේදනය (RS) හා භූගෝලීය පරිසර පද්ධතිය (GIS) පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති

දුරස්ථ සංවේදනය හා භූගෝලීය පරිසර පද්ධති භාවිතයෙන් මුලතිව් අර්ධ ශුෂ්ක කලාපයේ භූගත ජලය ගවේෂණය කිරීම

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ විස්තරාත්මක පරීක්ෂා කිරීම් සඳහා ඉලක්කගත ප්‍රදේශ සොයාගැනීම සඳහා භූගත ජල දර්ශක ආදර්ශක හරහා දෘඩ පාෂාණ හා මෘදු පාෂාණ (හුණුගල්) වල භූගත ජලය ගවේෂණය සඳහා RS සහ GIS තාක්ෂණයන්හි විභව්‍යතාව පෙන්නුම් කිරීමයි.

පර්යේෂණයේ පළමු අදියර සඳහා දත්ත රැස්කිරීම සඳහා පිළිවෙලින් පරිමාණය 1:50,000 හා 1:250,000 වන කේතීය හා භූගෝලීය සිතියම්, ලෑන්ඩ් සැට් දත්ත (8 හරහා 1 තීරුව) අවශ්‍ය වේ.



සියලු දත්ත භූ ලක්ෂණ සිතියම් සමග ජ්‍යාමිතිකව සම-ලියාපදිංචිවන අතර භූමිමිතිකව ට්‍රාන්ස්වර්ස් මර්කැටර් ප්‍රොජෙක්ෂන් හා WGS84 ඩේටම් වෙත මාරුකරන ලදී.

දෙවන අදියරේදී භූමියේ මතුපිට ලක්ෂණ, පාෂාණ වර්ගය, භූගෝලීය සිතියම්, බෑවුම් සිතියම්, ජලය බැසයාමේ ඝනත්වය සහ වියළි සෘතුවේ හරිත වගාවන් වැනි සමහර භූගත ජල දර්ශක ලබාගැනීම සඳහා දුරස්ථ

සංවේදන තාක්ෂණ භාවිතා කරනු ලැබීය. මෙම දත්ත GIS මොඩල සැකසීමේදී අවකාශමය තොරතුරු වෙන්කිරීම සඳහා යොදාගනු ලැබීය. ETM ලෑන්ඩ් සැට් මධ්‍යම අධෝරක්ත තීරුව භූමියේ මතුපිට ලක්ෂණ වැඩි කිරීම හා නිස්සාරණය සඳහා තෝරාගන්නා ලදී.

භූ රූප විද්‍යාව, භූමියේ මතුපිට ලක්ෂණ, LULC, බෑවුම, ජලය බැසයාමේ ඝනත්වය, පස් හා භූ විද්‍යා සිතියම් රැස්ටර් ආකෘතියට පරිවර්තනය කරන ලදී. ArcGIS පරිසරයේ ඇති මෙම සිතියම් මැනීම, පෙල ගැස්වීම හා වර්ගීකරණ කිරීම සඳහා විශ්ලේෂක ධූරානුක්‍රම ක්‍රියාවලිය අදාල කරගත් අතර සිතියම් වසාලීම මගින් භූගත ජල දර්ශක සිතියම් සකස්කර තිබේ.

තිරසාර ඉඩම් කළමනාකරණය සඳහා රසල් (RUSLE) ආදර්ශකය පාදක කරගෙන පාංශු බාදනයේ වේගය තක්සේරු කිරීම

පාංශු බාදනයේ භූමි ව්‍යාප්තිය ඇස්තමේන්තු කිරීම, GIS හා RS දත්ත සමගින් ප්‍රතිශෝධිත සාර්ව පාංශු හානි සමීකරණය (RUSLE) යොදාගනිමින් ප්‍රමාණාත්මකව හා භූමියේ විහිදී ඇති ප්‍රමාණය අනුව වාර්ෂික පාංශු හානිය ඇස්තමේන්තු කිරීම සහ පාංශු බාදනයවීමේ ප්‍රවණතාවක් ඇති කලාප හා ප්‍රමුඛ ප්‍රදේශ ගණනය කිරීම සඳහා දුරස්ථ සංවේදී දත්ත හා GIS දත්ත සමගින් ප්‍රතිශෝධිත සාර්ව පාංශු හානි සමීකරණය (RUSLE) මගින් ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණවේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සහ නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) යන ප්‍රමුඛ ශ්‍රී ලංකීය ආයතන පහකින් දත්ත හා තොරතුරු ලබාගනු ලැබීය.



පළමු අදියරේදී උඩරට, මැද රට හා පහත රට තේ වතු හැටක (60) දෘඩ පිටපත් ඩිජිටල්කරණය කරනු ලැබූ අතර දෛශික ආකෘතියකට පරිවර්තනය කරනු ලැබීය. දෙවන අදියරේදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති මාසික වර්ෂාපතන දත්ත, රස්ටර් ඡායාරූප ගණනය කිරීම් සඳහා භාවිතා කරන DEM, මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ලබාගත් පාංශු වර්ගවල ව්‍යාප්තිය, සහ ශ්‍රී ලංකා පාංශු විද්‍යා සංගමය මගින් පස් වර්ගවල ගුණාංග, ලෑන්ඩ් සැට් චන්ද්‍රිකා මගින් ඉඩම් භාවිතය හා ඉඩම් ආවරණ තොරතුරු සහ NDVI (Normalized Different Vegetation Index) පාංශු බාදන ආකෘතියේ යෙදවුම් ලෙස භාවිතා කරනු ලැබීය.

මෙම සිතියම් සංඛ්‍යාත්මක අගයන්ට පරිවර්තනය කිරීම සඳහා ArcGIS මෘදුකාංගය භාවිතා කෙරේ. රැස්ටර් විශ්ලේෂණය මගින් පාංශු හානිය ඇස්තමේන්තු කරනු ලැබීය. අධ්‍යයන ප්‍රදේශයේ පාංශු හානිය භෞමික ව්‍යාප්තිය ඇස්තමේන්තුගත කිරීම හා සිතියම්ගත කිරීම සඳහා එකම ප්‍රක්ෂේපණ පද්ධතිය ඇති (World Geodetic System 1984 / Universal Transverse Mercator 44N) සියලු පරාමිතීන් හා මීටර් 30 × මීටර් 30 කුටියක ඇති දත්ත විභේදනය යොදා ගැනේ.

මෙකී කාර්යයේ ප්‍රතිඵලයක් ලෙස පාංශු බාදනයවීමේ ප්‍රවණතාවක් ඇති කලාප සහ ප්‍රමුඛ ප්‍රදේශ හඳුනා ගනු ලැබූ අතර RUSLE භාවිතයෙන් අධ්‍යයන ප්‍රදේශයේ වාර්ෂික පාංශු හානිය ඇස්තමේන්තුගත කරනු ලැබීය.

SAR දත්ත භාවිතයෙන් භෞමික කඩොලාන පෙව ස්කන්ධය ඇස්තමේන්තුගත කිරීම

වන ආවරණය පරිසර පද්ධතියේ වැදගත් සංරචකයක්වේ. එබැවින් වඩා හොඳ වන කලමනාකරණය සඳහා නිරන්තර වන තත්වය අධීක්ෂණය සඳහා ශක්තිමත්, භාවිතයට පහසු ක්‍රමවේදයක් අවශ්‍යයවේ. වනයේ උස එහි පැවැත්ම තීරණය කිරීමේ වැදගත් දර්ශකයක්වේ. ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධතිය විනාශවීමේ තර්ජනයට ලක්ව ඇති අතර වෙරළාසන්න ප්‍රදේශයන්හි කඩොලාන විශේෂ ප්‍රතිස්ථාපනය කිරීම කෙරෙහි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අවධානය යොමුකර ඇත. පෙව ස්කන්ධය යනු සම්පූර්ණ සජීවී ස්කන්ධය වන අතර එය ශාකයේ කාබන් ප්‍රමාණය ගණනය කිරීම සඳහා උපකාරීවේ. මෙලෙස වනයේ උස භාවිතයෙන් වනයේ පෙව ස්කන්ධය ඇස්තමේන්තු කළ හැකිවේ.

සෙන්ටිනෙල් 1 එකම ක්‍රියාත්මක නොමිලේ ලබාගත හැකි SAR සංවේදකය වන අතර SAR භාවිතයෙන් භූමියේ අන්තරාමිතික ත්‍රිමාන තොරතුරු ලබාගත හැකිවේ. සී තීරුවේ අඩු විනිවිදයාමේ හැකියාව නිසා ඩිජිටල් උන්නතාංශ මොඩල මගින් පොළව මතුපිට කෙලින් සිටුවා ඇති වස්තුවක උස පෙන්නුම් කෙරේ.

විද්‍යාඥයින් විසින් ප්‍රධාන වන විද්‍යා ලක්ෂණ, වන ගහණයේ උස ගණනය කිරීම සඳහා මෙම ක්‍රමය හා හඳුන්වා දී ඇති නව මොඩල යොදාගනු ලැබේ.



කෙසේවුවද, SAR සංවේදක පමණක් භාවිතයෙන් කඳුකර ඝන වනාන්තර වල උස ඇස්තමේන්තු කිරීම තවමත් අභියෝගාත්මක කරුණකි. නමුත් නව මොඩයුල නිර්මාණය කරමින් පවතී.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ SAR දත්ත භාවිතයෙන් ලබාගත් ශාක උස සම්බන්ධ ගණනය කිරීම් මගින් භෞමික කඩොලාන පෙව ස්කන්ධය (AGB) ඇස්තමේන්තු කිරීම, ක්ෂේත්‍රයේදි එකතුකරන ලද දත්ත හා SAR මගින් ලබාගත් දත්තවල නිරවද්‍යතාව ඇස්තමේන්තුගත කිරීම හා ක්ෂේත්‍රයේදී එකතුකරන ලද දත්ත හා නොමිලේ ලබාගත හැකි SAR සංවේදී පරාමිතීන් (Sentinel 1) දත්ත අතර සම්බන්ධතාවක් ඇති කිරීම හා නව මොඩල වලංගුභාවයට පත් කිරීමයි.

ක්ෂේත්‍රයේදී එකතුකරන ලද කඩොලාන පෙව ස්කන්ධ දත්ත සකස්කර ඇත. බාගත කරගත් චන්ද්‍රිකා දත්ත සකස්කර ඇත. ක්ෂේත්‍රයේදී එකතුකරන ලද දත්ත හා චන්ද්‍රිකා පාදක පරාමිතීන් අතර සම්බන්ධතා මොඩල සකසන ලදී. කඩොලාන පෙව ස්කන්ධ සිතියම් උත්පාදනය කරනු ලැබීය.

පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ලබාගැනීම හා බෙදාහැරීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම

පවතින පෘථිවි නිරීක්ෂණ (දුරස්ථ සංවේදී) චන්ද්‍රිකා දත්ත විවිධ ආයතන වලට ලබාදීම මගින් රටේ සංවර්ධනය සඳහා දුරස්ථ සංවේදී දත්ත ඵලදායි ලෙස භාවිතා කිරීමේ දැක්ම ඇතිව ACCIMT විසින් 2013දී ශ්‍රී ලංකා රජයට ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය. ඒ සඳහා 2014 වසරේදී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය හිමිවූ අතර විදේශ සහයෝගිතාවය සඳහා නිර්දේශ කෙරිණ. චීනයේ RADI ආයතනය (දුරස්ථ සංවේදනය හා ඩිජිටල් පෘථිවි ආයතනය) මෙම ව්‍යාපෘතිය සඳහා ACCIMT ට සහයෝගිතාව ලබාදීමට එකඟ විය. ආයතන දෙක අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව RADI ආයතනය විසින් තාක්ෂණික උපකරණ, ස්ථාපනය හා පුහුණුව, ශ්‍රී ලංකාව හා එහි අනන්‍ය ආර්ථික කලාපය (EEZ) ආවරණය කරන චීනයේ GF චන්ද්‍රිකා මගින් චන්ද්‍රිකා දත්ත හා යෝජිත භෞමික මධ්‍යස්ථානය මගින් ලබාදෙන අතර ACCIMT විසින් භෞමික චන්ද්‍රිකා මධ්‍යස්ථානයේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සිදුකෙරේ. මෙය ක්‍රියාත්මක වූවිට විශේෂයෙන්ම චීන චන්ද්‍රිකා මගින් ශ්‍රී ලංකාවට ඉහල විභේදනයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීමට හැකිවනු ඇත.

භෞමික චන්ද්‍රිකා මධ්‍යස්ථානය සඳහා 'තලගලවත්ත' ලෙස හැඳින්වෙන අක්කර 12ක ඉඩම සඳහා තාක්ෂණ ශක්‍යතා අධ්‍යයනය සිදුකරනු ලැබිය. චීන හවුල්කරු විසින් ඇන්ටනා ඉදිකිරීම ආරම්භ කරනු ලැබිය.

5.6 පර්යේෂණ ප්‍රකාශන

I. Follow-up Ground-based Observations of the Dwarf Nova KZ Gem
Zhibin Dai, Paula Szkody , John R. Thorstensen , සහ එන්.
ඉන්දික මැදගංගොඩ; The Astrophysical Journal, 893:58 (17pp), 2020 April 10

II. Characterizing the possible interior structures of the nearby Exoplanets Proxima Centauri b and Ross-128 b
මහේෂ් හේරත්, සරාජ් ගුණසේකර සහ චන්දන ජයරත්න; MNRAS 00, 1 (2020) Advance Access publication 2020 October 15

III. Investigate the Sensitivity of the Satellite based Agricultural Drought Indices to Monitor the Drought Condition of Paddy and Introduction to Enhanced Multi- temporal Drought Indices
ජයවර්ධන WGNN, චතුරංග VMI; Journal of Remote Sensing and GIS, Volume 9, Issue 2 (2020)

5.7 පරීක්ෂා කිරීම් හා මිනුම්, දෘඩකාංග පිළිසකර කිරීම් හා උපදේශක සේවා

විදුලිබල ඉලෙක්ට්‍රොනික මිනුම් විද්‍යාගාරයේ පරීක්ෂාකිරීම් හා මිනුම් සේවාවන් - ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය



වසර තුල මෙම අංශය මගින් ප්‍රධාන වශයෙන්ම බැටරි, සර්ජ් ආරක්ෂක උපකරණ (SPDs), විදුලි පේනු, සොකට්, ස්විච හා අපවර්තක සඳහා කාර්යසාධන පරීක්ෂණ වාර්තා 122ක් නිකුත්කරනු ලැබීය. තවද පාරිභෝගික පිහිටීම වලදි සිදුකරන ලද විදුලිබල තත්ව මිනුම් වලට අමතරව අංශය මගින් විද්‍යුත්/ ඉකේ්ට්‍රොනික නිෂ්පාදන වල ආරක්ෂාව පරීක්ෂා කිරීම් හා විදුලිබල තත්ව මිනුම් සිදුකරනු ලැබිය.

ඩග්ලස් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, කෙවිල්ටන් ඉලෙක්ට්‍රිකල් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, සී.ඊ.එල්. ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ඒ.සී.එල් ඉලෙක්ට්‍රික් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන ආයතන ප්‍රධාන සේවාලාභීන් වේ.

ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය විසින් සිදුකළ ගැටළු සඳහා විසඳුම් ලබාදීමේ/අළුත්වැඩියා කිරීමේ සේවා හා උපදේශන කාර්යයන්

සමාලෝචනයට ලක්වන කාලය තුල ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය විසින් උපදේශන හා දෘඩකාංග පිළිසකර කිරීමේ කාර්යයන් 23ක් සිදුකරනු ලැබිය.

සිදුකරනු ලැබූ මූලික් දෘඩකාංග පිළිසකර කිරීම් හා උපදේශන සේවාවන්;

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සඳහා කාර්මික උදුන අලුත්වැඩියා කිරීම
- SD&CC සඳහා PLC’s තාක්ෂණ වාර්තා නිකුත් කිරීම.





වගකීම් නඩත්තු කිරීම හා ගිවිසුම්ගත සේවාවන්

සමාලෝචිත වර්ෂය තුල මහජන උපයෝගිතා කොමිසන් සභාව සඳහා නිර්මාණයකර නිපදවන ලද වැඩිදියුණු කල සත්‍ය RMS වෝල්ටීයතා රෙකෝඩර 05ක් හා දුරස්ථ වෝල්ටීයතා දත්ත ගබඩාවක් සාර්ථකව ක්‍රියාත්මකවීම සඳහා නඩත්තු කරනු ලැබීය.

සන්නිවේදන අංශය විසින් සිදුකරන ලද පරීක්ෂා කිරීම් හා මිනුම් සහ උපදේශන සේවා

කර්මාන්ත සඳහා උපදේශන සැපයීම, කොක්සියල් කේබල, නෙට්වර්ක් කේබල, ඇන්ටනා හා RF උපකරණ වල පිරිවිතර, ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම හා ගුවන් විදුලි සංඛ්‍යාත යෙදවුම් සඳහා පරීක්ෂා කිරීම් හා මිනුම් සේවාවන් සැපයීම මේ යටතේ සිදුකරනු ලැබූ කාර්යයන්වේ.

පහත සමාගම් සඳහා උපදේශන සිදුකරනු ලැබීය.

- බ්‍රැන්ඩික්ස් ප්‍රයිවට් ලිමිටඩ්
- සබරගමුව විශ්ව විද්‍යාලය

නෙට්වර්ක් කේබල් හා කොක්සියල් කේබල් පරීක්ෂා කිරීම් (පිරිවිතර/සහතිකකරණය)

කේබල් සොලුයුෂන්ස් ප්‍රයිවෙට් ලිමිටඩ් සඳහා කේබල් පරීක්ෂා කිරීම හා සහතිකකරණය සිදුකරනු ලැබීය.

පරීක්ෂා කිරීමේ හා මිනුම් සේවා

පොලිස් සන්නිවේදන ඒකකය සඳහා විශේෂ අවශ්‍යතා මත ගුවන් විදුලි සංඛ්‍යාත මැනීම ආශ්‍රිත මිනුම් සිදුකරනු ලැබීය.

ක්‍රමාංකන විද්‍යාගාරය මගින් සිදුකළ උපකරණ ක්‍රමාංකනය කිරීම් / ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමේ සේවාවන් - කාර්මික සේවා අංශය



සමාලෝචිත වර්ෂය තුල ප්‍රධාන වශයෙන් ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් පරීක්ෂා කිරීම් උපකරණ සඳහා ක්‍රමාංකන සේවාවන් සපයනු ලැබූ අතර කර්මාන්තවල ඉල්ලීම අනුව ක්‍රමාංකන වාර්තා 104ක් නිකුත් කරනු ලැබීය. ඩිජිටල්/ ඇනලොග් මල්ටි මීටර්, ඩෝලනේක්ෂ, ස්කෝප් මීටර් AC/DC ක්ලැම්ප් මීටර්, ඉහල වෝල්ටියතා ටෙස්ටර, හිපොට් ටෙස්ටර්, ප්‍රොසෙස් මීටර්, විදුලි බල හා සංඛ්‍යාත විශ්ලේෂක, වොට් මීටර, වෝල්ට් මීටර, විදුලි බලයේ තත්වය විශ්ලේෂක, එහා මෙහා ගෙනයා හැකි යන්ත්‍ර පරීක්ෂා කිරීමේ උපකරණ, තාප පරිවරණය අඛණ්ඩතාව පරීක්ෂා කිරීමේ උපකරණ, භූගත කිරීම් පරීක්ෂා කිරීමේ උපකරණ, RCCB පරීක්ෂා කිරීමේ උපකරණ, බහුකාර්ය පරීක්ෂා කිරීමේ උපකරණ හා Loop ටෙස්ටර ක්‍රමාංකනය කරන ලද උපකරණ වලට අයත්වේ.

LTL ට්‍රාන්ස්ෆෝමර්ස්, කොහුකු ලංකා, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, වෙගා කැලිබ්‍රේෂන් සර්විසස්. එලිවේටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ප්‍රොෆෙෂනල් මෙට් කන්සල්ටන්සි, වෙනෝරා ඉන්ටර්නැෂනල්, ඩේවිඩ් පීරිස් මෝටර් සමාගම, බැල්ෆෝ බියටි, පුබුදු ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්, රිචඩ්සන් ප්‍රොපෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඉලෙක්ට්‍රෝ මෙටල් ප්‍රොසෙසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආදි ආයතන අපගේ ප්‍රධාන සේවාලාභීන් විය.

කාර්මික සේවා අංශයේ ආලෝක මිනුම් විද්‍යාගාරය මගින් ලබාදෙන ආලෝක මිනුම් සේවා





LED හා DC ලාම්පු පරීක්ෂාකිරීමේ ආලෝක මිනුම් සේවා සිදුකරනු ලැබූ අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහයෝගීතාවය ඇතිව පරීක්ෂණ වාර්තා නවයක් නිකුත්කරනු ලැබීය. මින්ග් ඉන්ඩස්ට්‍රිස් (ප්‍රයිවට්) ලිමිටඩ්, රිසිල්කෝ මාකටින්, සුගත් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් සිග්නිෆයි (ලංකා ප්‍රයිවට්) ලිමිටඩ් අපගේ ප්‍රධාන සේවාදායකයන් විය.

විදුලිබල ඉලෙක්ට්‍රොනික මිනුම් විද්‍යාගාරය වැඩිදියුණු කිරීම.



විදුලි පේනු, සොකට්, ස්විච, අවශේෂ ධාරා පරිපථ විසන්ධි කිරීමේ උපකරණ (RCCBs), RCBOs, ක්ෂුද්‍ර පරිපථ විසන්ධි කිරීමේ උපකරණ (MCBs) හා වෙනත් අදාල උපාංගවල ද්‍රව්‍යයන්හි බලපෑම් ප්‍රතිරෝධය තීරණය කිරීම සඳහා අවලම්බ බලපෑම් පරීක්ෂා කිරීම් උපකරණ (Pendulum impact test apparatus) මිලදී ගනු ලැබීය.

6.1 වෘත්තිකයින් සඳහා අඛණ්ඩ වෘත්තීය පුහුණු සංවර්ධන (CPD) වැඩසටහන්

වැඩසටහන් ගත කළ හැකි ලොජික් පාලන පද්ධතිය

ඉංජිනේරුවන්, තාක්ෂණ නිලධාරීන් හා උපාධි අපේක්ෂකයින්ගෙන් සමන්විත තාක්ෂණ ක්ෂේත්‍රයේ 31 දෙනෙකු සඳහා මෙම දින පහක වැඩසටහන් ගතකළ හැකි ලොජික් පාලන පද්ධතිය පිළිබඳ S7-1200 හා S7-200 PLC පාඨමාලාව පවත්වනු ලැබීය. සහභාගිවුවන්ට කාර්මික ස්වයංක්‍රියකරණයේදී භාවිතාවන PLC හා HMI උපාංග වැඩසටහන්ගත කිරීම පිළිබඳ න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුම ලබාදෙනු ලැබීය



ඩිජිටල් බලපෑමක් ඇති නවීන ඉලෙක්ට්‍රොනික පරීක්ෂා කිරීම් හා මැනුම් උපකරණ

තාක්ෂණ පුද්ගලයින් 29 දෙනෙකු සඳහා එක් CPD පාඨමාලාවක් පැවැත්වූ අතර සහභාගිවූවන් සඳහා දෝලනේක්ෂ, වර්ණාවලි විශ්ලේෂක, ලොජික් විශ්ලේෂක, සම්ප්‍රේෂණ උපකරණ වැනි නවීන ඉලෙක්ට්‍රොනික භාවිතය, යෙදවීම, ඒවායේ වාසි හා සීමාවන් හා උපකරණ බිම්ගත කිරීම හා බැඳිමි, උපකරණ ක්‍රමාංකනය කිරීම හා පරීක්ෂා කිරීමේ හා මැනුම් උපකරණ වල දෝෂ පිළිසකර කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදෙනු ලැබීය.

රොබොටික් පිළිබඳ අන්තර්වාර වැඩමුලුව

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් යොමුකල 8 දෙනෙකු (විද්‍යාතා නිලධාරීන්) සඳහා රොබොටික් යෙදවුම් පිළිබඳ මූලික සෛධ්‍යාන්තික හා ප්‍රායෝගික පුහුණුව හා රොබොටික් උපකරණ කට්ටල භාවිතය පිළිබඳ ප්‍රායෝගික දැනුම සහිත දින 3ක පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබීය.





CCTV ආරක්ෂක පද්ධති (ELV) සකස් කිරීම, ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම

මූලිකවම විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් යොමුකල 25 දෙනෙකු (විද්‍යාතා නිලධාරීන්) සඳහා එක් CPD වැඩසටහනක් පවත්වනු ලැබීය. සහභාගිවූවන් සඳහා දැනට වෙළඳපලෙහි ඇති උපාංග භාවිතාකර CCTV පද්ධති නිර්මාණයකර ඔවුන්ටම එය සකස්කර ස්ථාපනය කිරීමේ දැනුමට නිරාවරණය වීමට ඉඩසලසනු ලැබීය. සහභාගිවූවන්ට එක් එක් සංරචකය පිළිබඳ න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගිකව අත්හදා බැලීමේ අවස්ථාව සළසා දී තමාගේම කර්මාන්තයක් කරගෙන යාම පිළිබඳව මෙහිදී මූලික වශයෙන් අවධානය යොමු කෙරිණ.

6.2 මූලික හා මධ්‍යම මට්ටමේ තාක්ෂණික පුහුණු

ප්‍රායෝගික ඉලෙක්ට්‍රොනික පාඨමාලාව

ඉලෙක්ට්‍රොනික විද්‍යාව මුලසිට ඉගෙනීමට උනන්දුවක් දක්වන පුද්ගලයින් සඳහා මෙම (දින 24) සති අන්ත පුහුණු පාඨමාලාව පවත්වනු ලැබීය. මේ සඳහා 60දෙනෙක් සහභාගිවු විය. මෙම වැඩසටහන මගින් සිසුන්ට ඇනලෝග් ඉලෙක්ට්‍රොනික විද්‍යාව, ඩිජිටල් ඉලෙක්ට්‍රොනික විද්‍යාව, මූලික උපකරණ හා ක්ෂුද්‍ර පාලක ආදී විෂය ක්ෂේත්‍රයන් ඇතුළුව ප්‍රායෝගික පුහුණු සඳහා නිරාවරණයවීමේ අවස්ථාව ලැබිණ. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වැඩසටහන නතර කිරීමට සිදුවූ අතර 2021 වසරේදී නැවත ආරම්භ වනු ඇත.

6.3 විද්‍යාව හා තාක්ෂණය ජනප්‍රිය කිරීම හා තොරතුරු බෙදාහැරීම සහ තාරකා විද්‍යාව හා අභ්‍යවකාශ විද්‍යාව ජනප්‍රිය කිරීමේ වැඩසටහන්

ජල රොකට් අධ්‍යාපනික වැඩමුළුව සහ ජල රොකට් තරගය හා පෝස්ටර් තරගය

පාසල් සිසුන් අතර අභ්‍යවකාශ විද්‍යාව ජනප්‍රිය කරවීමේ අරමුණ ඇතිව ACCIMT ආයතනය විසින් වාර්ෂික ජල රොකට් හා පෝස්ටර් තරගය පවත්වනු ලැබේ. මෙම වසරේදී කොවිඩ් - 19 ගෝලීය වසංගතය හේතුවෙන් වාර්ෂික ජල රොකට් වැඩමුළුව හා තරගය අවලංගු කරනු ලැබූ අතර APRSAF විසින් තීරණය කරනු ලැබූ පරිදි මෙම වසරේ ජාත්‍යන්තර ජල රොකට් තරගය ද නොපැවැත්විණ. JAXA අභ්‍යවකාශ අධ්‍යයන ආයතනයේ ඉල්ලීම පරිදි එම ආයතනය සඳහා ශ්‍රී ලංකාවේ ජල රොකට් ක්‍රියාකාරකම්හි සාර්ථකත්වය පිළිබඳ අධ්‍යාපනික වීඩියෝ පටය සකස් කරනු ලැබීය. ඔක්තෝබර් මාසයේ පැවැත්වෙන APRSAF පෝස්ටර් තරගය සඳහා ඩිජිටල් පෝස්ටර් කැඳවනු ලැබීය.

ලෝක ග්‍රාහක දින වැඩසටහන

ලොව පුරා සිටින විද්‍යාඥයින් විසින් පෘථිවිය ආසන්නයේ ඇති ග්‍රාහක සොයා ගැනීමට, අධීක්ෂණය කිරීමට හා හඳුනාගැනීමට යම් ක්‍රියාමාර්ග ගෙන තිබේ. මෙහි ඇති වැදගත්කම හඳුනාගෙන මෙම වැඩසටහන් සඳහා රජයන්හි සහය ලබාගැනීම හා මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා 1908 ජූනි 30 වන දින සයිබීරියාවේ තුන්ගුස්කා ප්‍රදේශයට ඉහලින් අහසේ පිපිරුණු ග්‍රාහකය අනුස්මරණය කරමින් එක්සත් ජාතීන් විසින් ජූනි 30 වන දින ලෝක ග්‍රාහක දිනය ලෙස ප්‍රකාශ කරනු ලැබිය. මෙම වාර්ෂික ඉසව්ව සැමරීම සඳහා ලොව පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලබන අතර ACCIMT ආයතනයද මෙම ඉසව් සඳහා සහභාගිවේ. මෙම වසරේදී “Small Bodies of the Solar System: Influencing Life and Death on Earth” යන මැයෙන් වෙබිනාර් වැඩසටහනක් සංවිධානය කරන ලැබූ අතර මෙහිදී ඇ.එ.ජ. අරිසෝනාහි ග්‍රහලෝක විද්‍යා ආයතනයේ ජ්‍යේෂඨ විද්‍යාඥ ආචාර්ය නලින් සමරසිංහ මහතා විසින් දේශනයක් පවත්වනු ලැබිය. මේ සඳහා 136 දෙනෙකු ලියාපදිංචි වී තිබුණි.

2020 අර්ධ සූර්යග්‍රහණය නිරීක්ෂණය කිරීම

2020 ජූනි 21 දින ඇතිවූ වලයාකාර සූර්යග්‍රහණයේදී නිරීක්ෂණ සැසි පවත්වනු ලැබීය. මෙය ACCIMT වෙබ් අඩවිය හරහා සජීවිව විකාශය කරනු ලැබීය.

ප්‍රායෝගික තාරකා විද්‍යාව හඳුන්වාදීම යන මැයෙන් වැඩමුලුව

කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් මෙය අත්හැර දමනු ලැබීය. ඒ වෙනුවට 2020 අගෝස්තු 24-27 දින දක්වා 400කට වැඩි පිරිසකගේ සහභාගිත්වය ඇතිව තාරකා විද්‍යා වැඩමුලුවක් පවත්වනු ලැබීය.

ACCIMT ආයතනය නැරඹීම සඳහා අධ්‍යාපනික චාරිකා

ACCIMT ආයතනයේ පැවැත්වූ දේශන හා දුරදක්න පහසුකම් මගින් ඉදිරිපත් කිරීම් සඳහා පාසල් සිසුන් හා ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ පුද්ගලයින් 500ක පමණ පිරිසක් සහභාගි වූහ.

ප්‍රදර්ශන

රටේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ACCIMT ආයතනය අධ්‍යාපන අමාත්‍යාංශය සංවිධානය කරන ලද හෝමාගම පිටිපන NSBM හරිත සරසවියේ පැවැත්වූ INNO TECH 2020 ප්‍රදර්ශනය සඳහා පමණක් සහභාගි විය.







6.4 ACCIMT පුස්තකාලය

සන්නිවේදන, තොරතුරු තාක්ෂණ, ඉලෙක්ට්‍රොනික, ප්‍රෝටොන විද්‍යාව, රොබෝ විද්‍යාව හා අභ්‍යවකාශ තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි පොත්, වාර සඟරා හා වෙනත් අධ්‍යාපනික ලිපි ලේඛණවල හොඳ එකතුවක් ACCIMT පුස්තකාලය සතුව පවතී.

වෘත්තිකයින්, පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිවල නියලි පුද්ගලයින්, උපාධිධාරීන්, පශ්චාත් උපාධිධාරීන්, ශිෂ්‍යයින් ආදී අය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා තොරතුරු ලබාගැනීමේ පහසුකම් සැලසීම මෙම පුස්තකාලයේ මූලික කාර්යයවේ.





පුස්තකාල එකතුව

මෙරට මෙන්ම පිට රට වල විශ්වාසනීය හා ස්වාධින ආයතන වලින ලබාගත් නිරන්තර යාවත්කාලීන කරන ලද ඉතා වටිනා විශේෂිත වාර්තා හා ප්‍රකාශන එකතුවක් පුස්තකාලය සතුවේ. අත්පොත්, දත්ත පුස්තකාල, පරිශීලක සමීක්ෂණ, නිපයුම් මාර්ගෝපදෙශ, යෙදවුම් සටහන්, නිර්මාණ අරමුණු කරගත් පෙල පොත්, අති නවීන සමාලෝචන, විශ්ව කෝෂ, ශබ්ද කෝෂ, නාමාවලි, හඩ පට, දත්ත ගබඩා, ප්‍රමිතීන් ආදියෙන් එය සමන්විතවේ. සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය, අභ්‍යවකාශ තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආදී ක්ෂේත්‍රයන්ට අදාල විශේෂිත සඟරා වාරසඟරා අංශයෙන් ලබාගත හැක.

සම්පූර්ණ එකතුව:

පොත්	- 9115	හඩ පට	- 94
CD-ROM	- 745	VCD පට	- 130
ඩිඩියෝ පට	- 368	DVD පට	- 87

පුස්තකාල සේවාවන්

(අ) පොත් බැහැරදීමේ හා කියවීමේ පහසුකම්: ACCIMT ආයතනයේකාර්ය මණ්ඩලය හා පුහුණුවන්නන් සඳහා

(ආ) පොත් කියවීමේ පහසුකම්: බාහිර කථිකාචාර්යවරු හා උපදේශකයින්, ව්‍යාපෘතිවල නියලි උපාධිධාරීන් හා පශ්චාද් උපාධිධාරීන්, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පාඨමාලා සඳහා සහභාගිවන්නන් හා පෞද්ගලික හා ආයතනික සාමාජිකයන්

(ඇ) කියවන්නන් සඳහා ඇති පහසුකම්: ඡායා පිටපත් සේවාවන්, ස්කෑනින් පහසුකම්, අන්තර්ජාල පහසුකම්, ඉලෙක්ට්‍රොනික පුස්තකාල පහසුකම්, අන්තර් පුස්තකාල ණය, දැනුවත් කිරීමේ සේවාවන්, තොරතුරු හැ ලේඛණ සැපයීමේ සේවාවන් හා සෘජු මාර්ගගත නාමාවලිය

(ඈ) ප්‍රජාව සඳහා සේවාවන්: රාජ්‍ය හා පෞද්ගලික කාර්මික අංශයේ වෘත්තිකයන් සඳහා සාමාජිකත්වය පිරිනැමීම, වෘත්තිකයන් හා විද්වතුන් (අ. කාර්මික ක්ෂේත්‍රයේ පුද්ගලයින්, ආ. විශ්ව විද්‍යාල ආචාර්යවරු හා පර්යේෂකයින්, ඇ.විශේෂ උනන්දුවක් දක්වන සාමාන්‍ය ජනයා) තොරතුරු හා ලේඛන සැපයීමේ සේවා, ප්‍රදර්ශන හා තාරකා විද්‍යා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ප්‍රදර්ශන භාණ්ඩ ලබාදීම.

අන්තර්ජාලය හරහා මහජනයාට ප්‍රවේශවිය හැකි විවෘත නාමාවලිය (OPAC) (http://www.accimt.ac.lk).

අන්තර්ජාලය ඔස්සේ (www.accimt.ac.lk) ACCIMT පුස්තකාලයේ මාර්ගගත නාමාවලිය හරහා පොත් එකතුව පිළිබඳ තොරතුරු සඳහා ප්‍රවේශවිය හැක. (අප ආයතනික ජාලය හරහා පුස්තකාල එකතුව සෙවීම හා ඒ සඳහා ප්‍රවේශවීම සඳහා අපගේ පරිශීලකයින්ට පරිගණකද ලබා දී ඇත. පරිශීලකයින්ට රචකයා, මාතෘකාව හෝ මූලික වචන මගින් ලේඛන සොයාගත හැක).

7.0 මානව සම්පත් සංවර්ධනය

ACCIMT පුස්තකාලයේ යූ-ටියුබ් චැනලය

ACCIMT පුස්තකාලයේ යූ-ටියුබ් චැනලය ඔස්සේ ශිෂ්‍යයන් හා පර්යේෂකයින් සඳහා මාර්ගගත සම්පත් වලට පිවිසීමට හැකිවේ.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ACCIMT ආයතනය සඳහා දැනට වැටුප් කාණ්ඩ 15 යටතේ තනතුරු නාම 51 සඳහා කාර්ය මණ්ඩලය 177ක් අනුමත කර තිබේ. 2020 වසර අවසානය වනවිට මෙම අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 97ක් සඳහා බඳවාගෙන තිබූ අතර තනතුරු 80ක් පුරප්පාඩුව පැවතිණ. පුරප්පාඩු වලින් වැඩි සංඛ්‍යාවක් ඉන්ජිනේරු උපාධිය හෝ ඒ හා සමාන වාත්තීය සුදුසුකම් වැනි මූලික සුදුසුකම් අවශ්‍ය කරන තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරු වේ.

විශේෂයෙන්ම පුරප්පාඩුව පවතින තනතුරු 80න් බහුතරයක් ඉහළ කළමනාකරණ කාණ්ඩයයේ තාක්ෂණික (HM) හා අධ්‍යයන පර්යේෂණ (AR) කාණ්ඩයට අයත් වේ. ඉහළ කළමනාකරණ තාක්ෂණික හා අධ්‍යයන පර්යේෂණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් අනතුරුව තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලයේ අනෙක් පුරප්පාඩු අවශ්‍ය පරිදි හා අවශ්‍ය විටක පුරවනු ඇත.

සලකා බලන ලද කාලය තුළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය), පර්යේෂණ ඉංජිනේරුවෙකු හා ඉංජිනේරු සහායකයින් 02ක් ඇතුලුව සේවකයින් 4 දෙනෙකු ඉල්ලා අස්විය.



+



8.0 2020 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

ශ්‍රවිත ආක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය තත්ත්වයෙහි ප්‍රකාශය

	සටහන්	2020 රු.	2019 රු.
ආදායම්			
රජයේ ප්‍රදාන	(01)	196,079,400.75	225,363,000.33
වෙනත් ආදායම	(02)	12,809,243.10	19,406,503.55
මුළු ආදායම්		208,888,643.85	244,769,503.88
වියදම්			
පුද්ගල වේතන	(03)	118,641,811.23	117,512,650.34
ගමන් වියදම්	(04)	126,444.42	2,047,656.05
සැපයුම් හා අවශ්‍යතා	(05)	1,079,006.37	2,737,039.61
ඇලුත්වැඩියා හා නඩත්තු	(06)	44,867,309.76	46,480,410.29
උපයෝගිතා සහ වෙනත් සේවාවන්	(07)	24,261,382.72	22,589,968.60
ව්‍යාපෘති වියදම්	(08)	3,950,270.61	4,103,123.21
පර්යේෂණ හා සංවර්ධන වියදම්	(09)	11,881,688.22	41,168,653.88
වෙනත් මෙහෙයුම් වියදම්	(10)	165,438.37	1,677,273.76
මුළු වියදම්		204,973,351.70	238,316,775.74
කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය)		3,915,292.15	6,452,728.14
ආදායම් හා වියදම් විසර්ජන හිඟුම්			
2020.12.31 දිනෙන් අවසන් වන වසර සඳහා			
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)		3,915,292.15	6,452,728.14
PC හිඟුම් මගින් උත්පාදනය වූ ඇරමුදල් වලින් අතිරික්තය මාරුකිරීම		(1,405,548.84)	(2,995,507.71)
වසර සඳහා ශුද්ධ ලාභය		2,509,743.31	3,457,220.43

වැදගත් හිඟුම්කරණ ප්‍රතිපත්ති හා පිටු 5 සිට 12 දක්වා වන වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදලට සමානදෑ	(11)	15,845,888.28	4,469,861.83
කෙටිකාලීන ආයෝජන	(12)	66,062,878.08	59,449,756.88
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	(13)	34,644,499.35	33,505,185.16
භාණ්ඩ වට්ටෝරු	(14)	9,948,346.01	10,126,765.43
පෙර ගෙවීම්	(15)	2,299,501.86	3,898,608.66
		128,801,113.58	111,450,177.96
ජංගම නොවන වත්කම්			
කාර්යමණ්ඩල ණය	(13.3)	10,578,037.00	12,253,758.00
දේපළ, පිරියත හා උපකරණ	(16)	251,368,693.41	281,364,859.80
සිදුකරමින් පවතින කාර්යයන් (ඉදිකිරීම්)	(17)	3,656,008.40	3,656,008.40
		265,602,738.81	297,274,626.20
මුළු වත්කම්		394,403,852.39	408,724,804.16
සම කොටස් හා වගකීම්			
ජංගම වගකීම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	(18)	3,502,147.05	13,661,342.83
සමුච්චිත වියදම්	(19)	7,527,825.82	7,047,856.37
		11,029,972.87	20,709,199.20
ජංගම නොවන වගකීම්			
විලම්බිත ආදායම		11,206,591.00	4,599,397.58
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	(20)	49,678,539.54	43,072,003.78
		60,885,130.54	47,671,401.36
ප්‍රාග්ධන හා සංචිත			
රජය විසින් දායකවූ ප්‍රාග්ධනය	(21)	366,957,831.68	388,510,683.32
සංචිත	(22)	79,777,333.09	78,431,514.32
සමුච්චිත හිඟය	(23)	(124,246,415.78)	(126,597,994.03)
		322,488,748.99	340,344,203.61
සම කොටස් හා වගකීම් එකතුව		394,403,852.39	408,724,804.16
		0.00	(0.00)

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ හිණුම්කරණ ප්‍රමිතන්ති (SLPSAS) අවශ්‍යතාවයන්ට අනුකූල වන බව සහතික කරමි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ.
අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා හා ඒ වෙනුවෙන් අත්සන් කරනුයේ,

සභාපති **අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධානී** **වැ.ඔ.පෙතණ්ඩ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය)**

2020 පෙබරවාරි 28

වැදගත් හිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු 5 සිට 12 දක්වා වන වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020	2019
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ	රු.	රු.
කාල සීමාව සඳහා අතිරික්තය/ (හිඟය)	2,509,743.31	3,457,220.43
මුදල් නොවන සංචලනයන්		
ක්ෂය කිරීම්	39,109,712.53	37,923,346.25
ක්‍රමක්ෂය	(39,109,712.53)	(37,923,346.25)
බොල්ණය සඳහා ප්‍රතිපාදන	4,261,052.81	2,832,683.23
නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	7,079,173.26	7,604,484.80
සමුච්චිත ලාභ ගැලපීම්	(344,575.45)	4,052,235.23
පොළී ආදායම - ස්ථාවර තැන්පතු	(280,841.62)	(527,430.74)
පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත්	(734,201.74)	(908,281.09)
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන ප්‍රදාන	(11,869,688.22)	(41,164,653.88)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය/ (පාඩුව)	**620,662.35**	**(24,653,742.02)**
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (වැඩිවීම)/ අඩුවීම	(5,400,367.00)	23,363,887.36
තොග භාණ්ඩ වල අඩුවීම/ (වැඩිවීම)	178,419.42	(1,375,355.99)
පෙර ගෙවීම් වල (වැඩිවීම)/ අඩුවීම	1,599,106.80	2,929,334.10
ගෙවිය යුතු දෑ වල වැඩිවීම/ (අඩුවීම)	(10,159,195.78)	(1,377,096.21)
සමුච්චිත වියදම් වල වැඩිවීම/ (අඩුවීම)	479,969.45	(653,227.64)
මෙහෙයුම් මගින් උත්පාදනය වූ මුදල්	**(12,681,404.76)**	**(1,766,200.40)**
ගෙවන ලද නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය	(472,637.50)	(1,284,221.00)
ලැබූ පොළී ආදායම - ස්ථාවර තැන්පතු	280,841.62	527,430.74
ලැබූ පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත්	734,201.74	908,281.09
වත්කම් අපහරණය මත ලාභය/පාඩුව	(43,533.84)	
විලම්බිත ආදායම	6,607,193.42	1,894,027.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින්/ (යොදා ගත්) ශුද්ධ මුදල්	**7,106,065.44**	**2,045,517.83**
ආයෝජන ක්‍රියාකාරකම් මගින්/ (යොදා ගත්) මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියක හා උපකරණ අත්පත් කර ගැනීම්	(8,626,964.80)	(35,814,840.00)
කෙටි කාලීන ආයෝජන	(6,613,121.20)	(12,978,325.73)
කාර්යමණ්ඩල ණය සංචලනය	1,675,721.00	(4,321,431.00)
පොලිය හා වෙනත්		
පොලිය හා වෙනත් ලැබීම්		
දේපළ, පිරියක හා උපකරණ අපහරණය මගින් ලද මුදල්	52,912.00	-
සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් සංචලනය	-	8,088,239.73
ආයෝජන ක්‍රියාකාරකම් මගින්/ (යොදා ගත්) මුදල් ප්‍රවාහ	**(13,511,453.00)**	**(45,026,357.00)**
මූල්‍ය ක්‍රියාකාරකම් මගින්/ (යොදා ගත්) මුදල් ප්‍රවාහ		
ප්‍රාග්ධන ප්‍රදාන මගින් ලද මුදල්	29,117,000.00	57,000,000.00
අමාත්‍යාංශ ප්‍රාග්ධන ප්‍රදාන මගින් ලද මුදල්	-	13,156,751.40
ප්‍රාග්ධන ප්‍රදාන භාවිතා කිරීම	-	(37,489,528.52)
සංචිත සංචලනය	1,345,818.77	2,448,673.67
මූල්‍ය ක්‍රියාකාරකම් මගින්/ (යොදා ගත්) ශුද්ධ මුදල් ප්‍රවාහ	**30,462,818.77**	**35,115,896.55**
මුදල් හා මුදලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	**11,376,026.45**	**(9,631,143.02)**
වසර ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ	4,469,861.83	14,101,004.85
වසර අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ	**15,845,888.28**	**4,469,861.83**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල ඉතිරි කොටස 18 පිටුවට ගෙන යනු ලැබේ.

(05)

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31

සාමාන්‍ය ප්‍රතිපත්ති

වාර්තාකරණ ආයතනය

1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත යටතේ ස්ථාපිත නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (මෙහි මින්මතු "ආයතනය" ලෙස හඳුන්වන) මොරටුව, කටුබැද්ද, බණ්ඩාරනායක මාවතේ පිහිටා ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ:

අ. ශ්‍රී ලංකාවට නවීන තාක්ෂණය හඳුන්වාදීම වේගවත් කිරීම සඳහා

(i) නවීන තාක්ෂණයන් යොදාගැනීම සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධන ආරම්භ කිරීම, දිරිමත් කිරීම හා සිදුකිරීම

(ii) නවීන තාක්ෂණය යොදාගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් සිදුකරන කාර්යයන් සඳහා පර්යේෂණ හා සංවර්ධන සහය ලබාදීම සහ

(iii) රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් සිදුකරන කාර්යයන්හි අවශ්‍යතා අනුව නවීන තාක්ෂණය පිළිබඳව පුද්ගලයින් පුහුණු කිරීම.

ආ. අනාගත අධ්‍යයනයන් දිරිමත් කිරීම

සන්නිවේදනය හා අදාල තාක්ෂණයන්, නොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව, විදුලි සන්දේශනය, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික විද්‍යාව, අභ්‍යවකාශ තාක්ෂණය, රොබෝ විද්‍යාව, ෆොටෝනික්ස් හා නව ද්‍රව්‍ය නවින තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අයත්වේ.

සේවක සංඛ්‍යාව

වාර්තා කරනු ලබන කාලය අවසානයේ සේවයේ නියුතු ස්ථිර සේවක සංඛ්‍යාව 97කි.

පිළියෙල කිරීමේ පදනම

අ) අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා මූලය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විතවේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව පිළියෙල කර ඇත.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

ආ) මිනුම් සඳහා පදනම

අදාල සටහන් යටතේ සාධාරණ අගයන් පිළිබඳව සුදුසු අනාවරණයන් සිදුකරනු ලබන අවස්ථාවලදි හැර මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

ඇ) තුලනාත්මක තොරතුරු

වත්මන් කාලසීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම හා අන්තර්කාලීන තුලනාත්මකතාවය වැඩිදියුණු කිරීම සඳහා පසුගිය කාලය සඳහා මූල්‍ය ප්‍රකාශන මගින් වාර්තාකර ඇති සියලුම අගයන් පිළිබඳව ප්‍රමාණාත්මක, විස්තර කිරීම් හා සවිස්තරාත්මක දත්ත සහිතව තුලනාත්මක තොරතුරු මගින් අනාවරණය කර ඇත.

වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති සෑම කාලසීමාවකටම අනුකූල වනසේ පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇත.

ඈ) ව්‍යවහාර හා ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය

ආයතනයේ ව්‍යවහාර හා ගිණුම් ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදරිපත් කරනු ලැබේ.

වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, සියළු මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්න දහස් සංඛ්‍යාවෙන් ඉදිරිපත් කර ඇත.

ඉ) ඇස්තමේන්තු හා විනිශ්චයන්ගේ ප්‍රයෝජන

කළමනාකාරිත්වයට ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීම හා වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් වාර්තාවූ ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් සිදුකිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) ට අනුකූලව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අවශ්‍යවේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු හා යොදාගත් විනිශ්චයන්ගෙන් වෙනස් විය හැක.

ඇස්තමේන්තු හා වැදගත් උපකල්පනයන් සිදුකරගෙන යන පදනම මත සමාලෝචනය කෙරේ. සංශෝධන ඒවා සිදුකරනු ලැබූ කාලය තුලදී පමණක් හෝ සංශෝදන සිදුකරනු ලබන කාලය තුලදි හා අනාගත කාලයේදී, සංශෝධන මගින් වර්තමාන හා අනාගත කාලය යන දෙකම සඳහා බලපාන්නේ නම් ඇස්තමේන්තු සංශෝධන සිදුකරන කාලසීමාවේදී ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන හඳුනා ගැනේ.

ඇස්තමේන්තුවල වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු, මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් ප්‍රමාණ කෙරෙහි වඩා වැදගත් බලපෑම් ඇතිකරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේදී සිදුකරන අවිනිශ්චිත හා වැදගත් විනිශ්චයන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් වල ඇතුලත්වේ.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

වත්කම් හා ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම
දේපළ, පිරියත හා උපකරණ

අ) හඳුනාගැනීම හා මැනීම

දේපළ, පිරියත හා උපකරණවලට අයත් අයිතම පිරිවැය අගයට හෝ සමුච්චිත ක්ෂයවීම් අඩුකර සාධාරණ අගයට දැක්වේ.
මුලදී දේපළ, පිරියත හා උපකරණවලට අයත් සියළු අයිතම සමුච්චිත ක්ෂයවීම් අඩුකර පිරිවැය අනුව සටහන් කරනු ලැබේ. වත්කමක වැදගත් සංරචක හඳුනාගෙන වෙන් වෙන්ව ක්ෂය කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල වැදගත් කොටස් යම් කාල පරාසයකදී ප්‍රතිස්ථාපනය කළ යුතු වූ විට ආයතනය මගින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස අත්හැර නව කොටස හා එමගින් ප්‍රයෝජන ලබන කාලය හා ක්ෂයවීම පිළිබඳව සලකා බලන ලැබේ. වෙනත් සියළු අළුත්වැඩියාවන් හා නඩත්තු වියදම් දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ දැක්වේ.

ආ) පිරිවැය

දේපළ, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීමේ හෝ ඉදිකිරීමේ වියදම් සමග ඒ හා සම්බන්ධ වෙනත් හදිසි වියදම් ඒවායේ පිරිවැයවේ.

දේපළ, පිරියත හා උපකරණවල මිළදි ගැනීමේ වියදම හා එම වත්කම මගින් අපේක්ෂා කරන කාර්යය සඳහා ක්‍රියාත්මක තත්වයට ගෙන ඒමට සෘජු ලෙස දරන ලද වියදම් වලින් එකී පිරිවැය සමන්විතවේ.

වත්කමක් පවත්වාගෙන යාම හෝ එමගින් මුදල් ඉපයීමේ ධාරිතාවය ඉහල නැංවීම සඳහා ස්ථාවර ආකාරයේ වත්කමක් අත්පත්කර ගැනිම, එය පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා තදනන්තරව දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ප්‍රධාන පිරික්සුම් පිළිසකර කිරීමේ වියදම් ඇතුළුව දේපළ, පිරියත හා උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වෙන් වශයෙන් දරන ලද වියදම මුදල් බවට පත්කෙරේ. එකී කොටස් මගින් ආයතනයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබාදීමේ ප්‍රවනතාවක් ඇත්නම් හා එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් පමණක් වෙනත් තදනන්තර වියදම් මුදල් බවට පත්කෙරේ.

ආයතනය පිහිටි ඉඩම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දේපළක් වන අතර එය ආයතනය පවත්වාගෙන යාම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට පවරා ඇති බැවින් ඉඩමේ වටිනාකම මුල්‍ය ප්‍රකාශන වල සඳහන් නොවේ. ආයතනය හා මොරටුව විශ්ව විද්‍යාලය අතර ඇතිකරගෙන ඇති අවබෝධතා ගිවිසුම අනුව ආයතනයේ කටයුතු දිගටම සිදුකරමින් පවත්වාගෙන නොයන්නේ නම් ඉඩම මොරටුව විශ්ව විද්‍යාලයට භාරදිය යුතුය.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

ඇ) ක්ෂය කිරීම්

සින්නක්කර ඉඩම් හා සිදුකෙරෙමින් පවතින ඉදිකිරීම් සඳහා ක්ෂයවීම් ගණනය කරනු නොලැබේ. වෙනත් සියළු දේපළ, යන්ත්‍ර හා උපකරණවල පිරිවැය සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය අනුව සෘජු රේඛා පදනම මත පහත දැක්වෙන ලෙස සමාන වාරික වලින් ක්ෂයවීම් ගණනය කරනු ලැබේ.

වත්කම් කාණ්ඩය	වසරක් සඳහා ප්‍රතිශතය %
ගොඩනැගිලි	5
පරිගණක හා උපාංග	20
චන්ද්‍රිකා ඇන්ටනා, පර්යේෂණාගාර උපකරණ	10
කාර්යාල උපකරණ, ගෘහ භාණ්ඩ හා උපාංග	10
මෝටර් වාහන	20
පුස්තකාල පොත්	15

අත්පත්කර ගනු ලැබූ වත්කමක් ක්ෂයවීම ආරම්භ වන්නේ එය ප්‍රයෝජනයට ගත හැකි අවස්ථාවේ සිට වන අතර ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම වර්ගීකරණය කල දිනයේ සිට හෝ වත්කම ඉවත් කරන දිනය යන දින වලින් කලින් එළඹෙන දිනයේය.

භාණ්ඩ වට්ටෝරු

භාණ්ඩ වට්ටෝරු ලිපි ද්‍රව්‍ය තොග අයිතම, ඉලෙක්ට්‍රොනික උපාංග, උපකරණ හා මෙවලම් වලින් සමන්විතවේ. භාණ්ඩ සඳහා අඩුම මිල හා ශුද්ධ උපලබ්දි වටිනාකම භාණ්ඩ වට්ටෝරුවල සඳහන්වේ. ශුද්ධ උපලබ්ධි වටිනාකම වන්නේ භාණ්ඩය නිමකිරීම හා විකිණීම සඳහා වන වියදම් අඩුකර සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ඇස්තමේන්තුගත කළ විකුණුම් මිලයි.

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ, බොල් ණය හා සැකසහිත ලැබිය යුතු දෑ සඳහා වන දීමනා වල ශුද්ධ අගය උපලබ්දිවීම සඳහා ඒවා ඇස්තමේන්තු කරණ ලද අගයට දක්වනු ලැබේ.

වෙනත් ලැබිය යුතු දෑ හා අදාල පාර්ශව වෙතින් ලැබිය යුතු දෑ, බොල් ණය හා සැකසහිත ලැබිය යුතු දෑ සඳහා වන දීමනා අඩුකර ලැබෙන පිරිවැය වේ.

සාමාන්‍ය බොල් ණය ප්‍රතිපාදන පහත පරිදි තීරණය කරනු ලැබේ:

ඉකුත්වූ කාලසීමාව	අවශ්‍යවන ප්‍රතිපාදන
වසර 1-2	50%
වසර 2-3	75%
වසර 3ට වැඩි	100%

(09)

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

ආයෝජන

රජයේ සුරකුම්පත් හා රජයට අයත් බැංකුවල ස්ථාවර තැන්පතු වල පමණක් අරමුදල් ආයෝජනය කරනු ලැබේ. ආයෝජන මත වැඩි ආදායමක් ලැබීම, ද්‍රවශීලතාවය හා ප්‍රතිආයෝජන සඳහා පොළි අනුපාත අවදානම පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව ආයෝජන සිදුකරනු ලැබේ. සියළු නව ආයෝජන හා ප්‍රතිආයෝජන තීරණ සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම අවශ්‍යවේ.

මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ වන්නේ අත ඇති මුදල්, අවශ්‍ය විටක ආපසු ගතහැකි මුදල් හා කෙටි කාලීන දැඩි ද්‍රවශීල ආයෝජන, දන්නා ප්‍රමාණයෙන් ක්ෂණිකව මුදල් බවට පරිවර්තනය කල හැකි හා අගය වෙනස්වීමේ සුළු අවදානමකට ලක්වන දෑය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා, මුදල් හා මුදලට සමාන දෑ වලට අත ඇති මුදල් හා බැංකු අයිරාද ඇතුලත්ව තැන්පතු වල ඇති මුදල් ඇතුලත්වේ. කෙටි කාලයකදී කල් පිරෙන ආයෝජන, උදා:අත්පත් කරගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩුකාලයක්, මුදලට සමාන දෑ ලෙස සැලකේ.

වගකීම් හා ප්‍රතිපාදන

ඉල්ලුම මත ගෙවීමට ඇති හෝ වාර්තා කරනු ලබන දින සිට වසරක් ඇතුලත ගෙවීමට ඇති මුදල් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. වාර්තා කරනු ලබන දින සිට වසරකට පසුව ගෙවිය යුතු ශේෂයන් ජංගම නොවන වගකීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි දන්නා සියළු වගකීම් සැලකිල්ලට ගෙන ඇත. පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනයට නෛතික හෝ ප්‍රයෝජනවත් වන බැඳීමක් ඇතිවිට ප්‍රතිපාදන හා වගකීම් හඳුනා ගැනෙන අතර වගකීම් ඉටුකිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභයක් වැය කිරීම අවශ්‍ය විය හැක.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

සේවක ප්‍රතිලාභ

අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

විශ්‍රාම ප්‍රතිලාභ නිර්වචිත ප්‍රතිලාභ සැලසුමකි. මෙම වගකීම ඉටුකිරීම සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙනයනු ලැබේ. අනාගත පඩි වැඩිවීමේ අනුපාත, වට්ටම් අනුපාත හා අපේක්ෂිත කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාත සලකා බලා සූත්‍ර ක්‍රමය පදනම් කරගෙන ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ (මෙම උපකල්පනයන් 11.1 සටහන මගින් දැක්වේ). වසර ආරම්භයේ ඉදිරියට ගෙන ආ ප්‍රතිපාදන හා වසර අවසානයේ ඉදිරියට ගෙන ආ ප්‍රතිපාදන අතර ඇතිවන වෙනස පිළිබඳව විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මගින් කටයුතු කෙරේ. කෙසේවුවද 1983 අංක 12 දරණ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමේ පනත අනුව විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බාහිරව අරමුදල් සපයනු නොලැබේ. මෙම වගකීම මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් යටතේ කාණ්ඩ කර තිබේ.

ආ) සේවක අර්ථසාධක අරමුදල (EPF)

අදාල ව්‍යවස්ථාවන් හා නියෝගයන්ට අනුව සේවකයින් සේවක අර්ථසාධක අරමුදලට දායකවීම සඳහා සුදුසුකම් ලබාඇත. සේවකයින් හා ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදලට පිළිවෙලින් 15% හා 10%ක දායක කෙරේ. ආයතනයේ දායකත්වය, දරන ලද වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ.

ඇ) සේවක භාරකාර අරමුදල (ETF)

අදාල ව්‍යවස්ථාවන් හා නියෝගයන්ට අනුව සේවකයින් සේවක භාරකාර අරමුදලට දායකවීම සඳහා සුදුසුකම් ලබා ඇත. ආයතනය විසින් සේවක භාරකාර අරමුදලට 3%ක් දායක කෙරේ. මෙම දායකත්වයන්, දරන ලද වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දැක්වේ.

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ පිරිවැය අනුව දක්වා ඇත.

(11)

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

බදුකරණය

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 7(ආ)(ii) වගන්තිය යටතේ මෙම ආයතනය ආදායම් බදු වලින් නිදහස් කර ඇත.

ප්‍රග්ධන බැඳිම් හා අසම්භාව්‍ය වගකීම්

අවිනිශ්චිත වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් මගින් පමණක් ඒවා පවතින බව තහවුරු කරගත හැකි හෝ ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ සම්භාවිතාවක් නොමැති විට ඇතිවිය හැකි බැඳිම් හෝ විශ්වාසනියව මැනිය නොහැකි වත්මන් බැඳීම්ය. ආයතනයේ ප්‍රාග්ධන බැඳීම් හා අවිනිශ්චිත වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන සඳහා අදාල සටහන් වල අනාවරණය කර ඇත.

ප්‍රදානයන් ගිණුම්කරණය

දරන ලද වියදම් සඳහා ආයතනයට හානිපූරණය කරන ප්‍රදානයන් එම වියදම් හඳුනාගත් කාල සිමාවේදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අදායමක් ලෙස හඳුනා ගැනේ. වත්කමක පිරිවැයක් සඳහා ආයතනයට හානිපූරණය කරන ප්‍රදානයන් අදාල වත්කමෙහි ප්‍රයෝජනවත් ආයු කාලය අනුව ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

විශේෂ ව්‍යාපෘති වලට අදාල ප්‍රදානයන්

හඳුනාගත් ව්‍යාපෘතියක් හෝ ක්‍රියාකාරකමක් සඳහා යොදා ගැනීමට ප්‍රදාන/පරිත්‍යාගයන් ලැබුණු විට එකී අරමුදල් සීමිත අරමුදල් ගිණුමක තබාගෙන ආදායම එම හඳුනාගත් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වන වියදම් වලට ගැලපෙන සේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට මාරුකරනු ලැබේ. උපයෝජනය නොකරන ලද අරමුදල් ඒවා අවශ්‍යකරන කාලය තෙක් ඒවාට අදාල අරමුදල් ගිණුම් වල රඳවාගනු ලබන අතර සමුච්චිත අරමුදල් හා සංචිත යටතේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ ඇතුලත් කරනු ලැබේ.

ආදායම් හඳුනාගැනීම.

ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ සම්භාවිතාව හා විශ්වාසනීයව මැනිය හැකි ප්‍රමාණය අනුව ආදායම හඳුනාගනු ලැබේ.

අ) සිසුන්ගෙන් ලැබෙන පාඨමාලා ගාස්තු උපචිත පදනම යටතේ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

ආ) ව්‍යාපෘති ආදායම, උපදේශක ආදායම උපචිත පදනම යටතේ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

ඇ) පොලි ආදායම උපචිත පදනම යටතේ හඳුනා ගැනේ.

(12)

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

ආදායම් හඳුනාගැනීම (ඉතිරි කොටස)

ඈ) දායකත්වය පාලනය කිරීම හෝ දායකත්වය ලැබීමේ අයිතිය තහවුරු කළ විට ප්‍රදානයන්ට අදාල ආදායම හඳුනා ගනු ලැබේ.
ඉ) වෙනත් ආදායම් උපචිත පදනම යටතේ හඳුනා ගැනේ.

ව්‍යාපෘතිවල අතිරික්ත ආදායම උපයෝජනය

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සාමානයයෙන් ඇතුලත් ක්‍රියාකාරකම් වලට අමතරව සිදුකරන ලද ව්‍යාපාති මගින් ලැබෙන අතිරික්ත ආදායම විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සඳහා අදාල වන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380ට අනුකූලව උපයෝජනය කෙරේ.

වියදම

අ) දරනු ලැබූ වියදම් හා විශේෂ ආදායම් අයිතම මගින් වන ඉපයීම් අතර ඇති සෘජු සම්බන්ධය පදනම් කරගෙන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදම් හඳුනාගනු ලැබේ. ආයතනය පවත්වාගෙන යාම හා ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම ලෙස නවත්තු කිරීම සඳහා දරන ලද වියදම, වසර සඳහා අතිරික්තයක් ගෙන දෙන අවස්ථාවන්හිදී ආදායම් වලට එරෙහිව අයකර තිබේ.

ආ) පාඨමාලා, ව්‍යාපෘති හා උපදේශක සේවා හා වෙනත් ක්‍රියාකාරකම් සඳහා වන වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළියෙල කිරීමේ චක්‍ර ක්‍රමය යෙදාගනිමින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 2 (SLPSAS 2) ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර ඇත.

වාර්තාකරන දිනයට පසුව වන සිදුවීම්

වාර්තාකරන දිනයට පසුව සිදුවන ක්‍රියාකාරකම්වල අදාලත්වය පිළිබඳව සලකා බලා ඇති අතර අවශ්‍ය විට ගිණුම්වල සුදුසු පරිදි ගැලපීම් සිදුකර ඇත.

	2020	2019
(11) මුදල් හා මුදලට සමාන දෑ	රු.	රු.
ජංගම ගිණුම්	-	-
ලංකා බැංකුව		
- A/c No 7054733	8,223,710.30	1,802,236.87
- A/c No 307144	5,595,971.23	771,449.51
- A/c No 307399 (අධ්‍යක්ෂ මණ්ඩල අරමුදල)	1,866.46	26,221.76
- A/c No2479737 (චක්‍රීය අරමුදල)	1,186,597.28	1,036,674.63
මහජන බැංකුව		
- A/c No 313-1-001-9-0012847	678,804.83	678,804.83
කොමර්ෂල් බැංකුව පීපල්සි		
-A/c No 1114029211	26,500.00	26,500.00
ඉතිරිකිරීමේ ගිණුම්	-	-
ලංකා බැංකුව		
-A/c No 326764 (FINDS)	125,220.94	120,722.36
-A/c No 328391 (NASDA)	7,217.24	7,251.87
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් හා මුදලට සමාන දෑ	15,845,888.28	4,469,861.83
(12) ආයෝජන		
අරමුදලේ අතිරික්තය භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය - ව්‍යාපෘති/පාඩමාලා අරමුදල	10,657,579.96	9,858,380.48
අරමුදලේ අතිරික්තය භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය - අධ්‍යක්ෂ මණ්ඩල අරමුදල	-	-
අරමුදලේ අතිරික්තය භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය - චක්‍රීය අරමුදල	2,126,143.60	1,988,143.00
අරමුදලේ අතිරික්තය භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය - FINDS ප්‍රදාන	8,094,664.27	7,488,123.00
ස්ථාවර තැන්පතු 01(76387182)-චක්‍රීය අරමුදල	713,626.60	674,617.11
ස්ථාවර තැන්පතු 02(76387290)-චක්‍රීය අරමුදල	713,626.60	674,617.11
ස්ථාවර තැන්පතු 03(76387299)-චක්‍රීය අරමුදල	713,626.60	674,617.11
ස්ථාවර තැන්පතු 04(76387310)-චක්‍රීය අරමුදල	713,626.60	674,617.11
ස්ථාවර තැන්පතු 05(76387322)-චක්‍රීය අරමුදල	713,626.60	674,617.11
ස්ථාවර තැන්පතු 06(76387328)-චක්‍රීය අරමුදල	713,626.60	674,617.11
ස්ථාවර තැන්පතු 07(76387343)-චක්‍රීය අරමුදල	713,626.60	674,617.11
ස්ථාවර තැන්පතු 25(81820199)-අධ්‍යක්ෂවරයාගේ අරමුදල	30,765.11	27,997.84
ස්ථාවර තැන්පතු 08(81819773) - ව්‍යාපෘති අරමුදල	6,702,446.48	6,099,573.04
ස්ථාවර තැන්පතු 09(81819900) - ව්‍යාපෘති අරමුදල (මාස 6)	659,715.39	608,732.25
ස්ථාවර තැන්පතු10(81819988) - ව්‍යාපෘති අරමුදල (මාස 6)	659,715.39	608,732.25
ස්ථාවර තැන්පතු 11(81820008) - ව්‍යාපෘති අරමුදල (මාස 6)	659,715.39	608,732.25
ස්ථාවර තැන්පතු 12(81820127) - ව්‍යාපෘති අරමුදල (මාස 6)	659,715.39	608,732.25
ස්ථාවර තැන්පතු 13(81820031) - ව්‍යාපෘති අරමුදල (මාස 3)	648,142.78	603,742.61
ස්ථාවර තැන්පතු14(81820049) - ව්‍යාපෘති අරමුදල (මාස 3)	648,142.78	603,742.61
ස්ථාවර තැන්පතු15 (81820073) - ව්‍යාපෘති අරමුදල (මාස 1)	604,358.72	570,940.50
ස්ථාවර තැන්පතු 16 (81820087) - චක්‍රීය අරමුදල (මාස 1)	604,358.72	570,940.50
ස්ථාවර තැන්පතු 17 (81820099) - චක්‍රීය අරමුදල (මාස 1)	604,358.72	570,940.50
ස්ථාවර තැන්පතු 18 (81820155) - චක්‍රීය අරමුදල (මාස 1)	607,703.48	574,100.30
ස්ථාවර තැන්පතු 19 (81820136) - චක්‍රීය අරමුදල (මාස 1)	604,358.72	570,940.50
ස්ථාවර තැන්පතු 20 (81820174) - චක්‍රීය අරමුදල (මාස 1)	604,358.72	570,940.50
ස්ථාවර තැන්පතු 21 (81820186) - චක්‍රීය අරමුදල (මාස 1)	604,358.72	570,940.50
c/f	40,775,988.54	37,826,694.65

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල ඉතිරි කොටස 14 පිටුවට ගෙන යනු ලැබේ.

නවින තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

		2020 රු.	2019 රු.
(12) ආයෝජන (ඉතිරි කොටස)			
b/f		40,775,988.54	37,826,694.65
ස්ථාවර තැන්පතු 22 (81820244) - චක්‍රීය අරමුදල (මාස 1)		604,358.72	570,940.50
ස්ථාවර තැන්පතු 23 (81820190) - චක්‍රීය අරමුදල (මාස 6)		659,715.39	608,732.25
ස්ථාවර තැන්පතු 24 (81820194) - චක්‍රීය අරමුදල (මාස 6)		527,772.32	486,985.81
ස්ථාවර තැන්පතු 26 (81820180) - චක්‍රීය අරමුදල (මාස 6)		604,358.73	570,940.51
ස්ථාවර තැන්පතු -83214406 (RF)		1,551,319.99	1,412,127.55
ස්ථාවර තැන්පතු 27(83203809)චක්‍රීය අරමුදල		904,888.73	823,697.44
අරමුදල් කළමනාකරණ A/c(82097803)		20,434,475.66	17,149,638.17
		66,062,878.08	59,449,756.88
(13) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ			
කාර්ය මණ්ඩල ණයකරු - TG	(උපලේඛනය 02)	302.00	302.00
රක්ෂණ සංස්ථා ණයකරු		9,700.00	9,700.00
ලැබිය යුතු ගිණුම් - TG	(උපලේඛනය 02)	3,233,880.52	3,242,860.47
ලැබිය යුතු ගිණුම් - P/C	(උපලේඛනය 02)	4,474,141.66	3,929,130.24
ණයකරු - පී.ටී.ප්‍රනාන්දු මයා		4,000.00	4,000.00
ලැබිය යුතු ගිණුම් PF	(උපලේඛනය 02)	397,655.20	567,314.14
ලැබිය යුතු ගිණුම් RF	(උපලේඛනය 02)	38,382.83	63,345.72
ලැබිය යුතු ගිණුම් - FINDS	(උපලේඛනය 02)	56,718.31	88,315.08
ණයකරු - ටී.එන්.විතුමසිංහ			1,350.00
ණයකරු - ජයතු ප්‍රනාන්දු		106,894.72	106,894.72
ණයකරු - බී.ආර්.පී.පෙරේරා		39,699.66	39,699.66
ණයකරු - පී.ජී.කේ. රොඩ්‍රිගෝ		15,652.69	15,652.69
ණයකරු - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව		144,563.64	144,563.64
වෙනත් තැන්පතු		155,315.00	155,315.00
ආර්.එස්.ණයකරු		14,434.91	14,434.91
මැතිවරණ දෙපාර්තමේන්තුව		8,159.60	8,159.60
අමාත්‍යාංශ ණයකරු - ඩිෂ් ටීවී පැකේජය		33,381.50	33,381.50
උත්සව අත්තිකාරම්	(උපලේඛනය 03)	570,000.00	53,750.00
රාජ්‍ය නිලධාරීන් සඳහා අත්තිකාරම්		7,600.00	-
PC පාලන		(5,120,536.07)	(7,187,936.94)
ණයකරු - එල්.වී.විජේසිංහ		627.00	627.00
ණයකරු - පී.ඩී.ටී ද සිල්වා		9,711.80	9,711.80
		4,200,284.97	1,300,571.23

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල ඉතිරි කොටස 15 පිටුවට ගෙන යනු ලැබේ.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

	2020 රු.	2019 රු.
(13.1) සිදුකරමින් පවතින කාර්යයන් - ව්‍යාපෘති		
WIP - UAVAGR	828,187.91	622,206.71
WIP - EXOAID ව්‍යාපෘතිය (සන්නිවේදන අංශය)	-	183,180.30
WIP - UGVMED	102,200.00	102,200.00
WIP UAVTOL	-	223,341.20
WIP - ADCTSU ව්‍යාපෘතිය	-	3,765,313.90
WIP - ADCS ව්‍යාපෘතිය	-	4,190,464.38
WIP - CNCEDU ව්‍යාපෘතිය		452,007.50
WIP - UAVGCS ව්‍යාපෘතිය	678,815.47	-
2012/2013/SS/CCTV/NWSDB	4,222,053.46	4,220,713.46
PEC 27 - 2020	245,336.50	
ACCR ව්‍යාපෘතිය 2020 - ISD	41,925.00	
ටෙලිමොප් ව්‍යාපෘතිය	1,468.00	
SCADA ව්‍යාපෘතිය	900.00	
TEATEP ව්‍යාපෘතිය 2020	2,376,851.58	
RAWLM ව්‍යාපෘතිය 2019/සන්නි	268,752.60	
AWSETP 2020	526,699.80	
ජාතික මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (SAD)	219,879.04	219,879.04
නැනෝ චන්ද්‍රිකා වැඩසටහන SAD (CAPITAL)	4,489,814.04	4,158,688.49
අනතුරු ඇඟවීම් උපකරණ ව්‍යාපෘතිය 2020	95,840.95	-
විදුලි සැර වලින් ආරක්ෂාවීමේ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම (ECLP)	52,013.51	51,838.51
ECS 28		311,926.01
SOILRE ව්‍යාපෘතිය (ඉලෙක්ට්‍රොනික අංශය)	4,250.00	4,250.00
විද්‍යුත වැඩසටහන 2019		27,161.00
RVDL වගකීම් පවත්වාගෙන යාමේ ව්‍යාපෘතිය (ඉලෙක්ට්‍රොනික අංශය)		10,567.91
IRR මාතර ව්‍යාපෘතිය (සන්නිවේදන අංශය)	297,858.96	206,470.96
විදුලි සැර වලින් ආරක්ෂාවීමේ පද්ධතිය	67,458.45	33,362.45
වී වගාකළ ප්‍රදේශ හා අස්වැන්න පුරෝකථනය කිරීම (SAD) 2019	4,475.00	4,475.00
BLBTEA ව්‍යාපෘතිය 2019 (SAD)		18,150.00
PDM ව්‍යාපෘතිය 2019	9,150.34	2,280.00
දෝෂ කලින් හඳුනාගැනීම සඳහා විධිමිහකය (ඉලෙක්ට්‍රොනික අංශය)19EL017		177,906.30
PT POC ව්‍යාපෘතිය (Elec)	217,140.31	17,577.31
2019 සූර්යග්‍රහණය (SAD)		44,209.00
තේ කොළ තත්ව ශ්‍රේණිගත කිරීමේ හා වර්ණ වෙන්කිරීමේ පද්ධති ව්‍යාපෘතිය	11,247,497.23	10,247,497.23
කැලිස්ටො ගුවන් විදුලි වර්ණාවලීක්ෂමාන ව්‍යාපෘතිය	50,186.50	48,025.00

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල ඉතිරි කොටස 16 පිටුවට ගෙන යනු ලැබේ.

(16)

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

ස්වයංක්‍රිය වාරිමාර්ග ව්‍යාපෘතිය (ඉලෙක්ට්‍රොනික අංශය)		14,884.27
කෘෂිකාර්මික නියග අධීක්ෂණ පද්ධතිය (STA)		750.00
තලවකැලේ වර්ණාවලි දත්ත රුස්කිරීම (SAD)		19,070.00
ධාරිතා සංවර්ධන වැඩසටහන-STD		98,168.61
ස්වයංක්‍රිය වාරිමාර්ග ව්‍යාපෘතිය (ඉලෙක්ට්‍රොනික අංශය)	22,107.72	5,425.05
ECGTA ව්‍යාපෘතිය (ඉලෙක්ට්‍රොනික අංශය)	109,602.82	109,602.82
	26,180,465.19	29,914,097.16

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල ඉතිරි කොටස 17 පිටුවට ගෙන යනු ලැබේ.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

		2020 රු.	2019 රු.
(13.2) සිදුකෙරෙමින් පවතින කාර්යයන් - පාඨමාලා			
භූගෝලිය තොරතුරු පාඨමාලා		-	-
(13.3) කාර්ය මණ්ඩල ණය			
ආපදා ණය	(උපලේඛනය 04)	14,704,102.00	13,524,160.00
මෝටර් සයිකල් ණය	(උපලේඛනය 05)	738,337.00	596,813.00
මෝටර් රථ ණය	(උපලේඛනය 06)	3,660,400.00	3,187,203.00
ගංවතුර සහන ණය	(උපලේඛනය 06)	-	68,782.00
		19,102,839.00	17,376,958.00
එක් වසරකට පසු කාර්ය මණ්ඩල ණය		(10,578,037.00)	(12,253,758.00)
එක් වසරක් තුල කාර්ය මණ්ඩල ණය		8,524,802.00	5,123,200.00
වෙළඳ හා වෙනත් ලැබිය යුතු		38,905,552.16	36,337,868.39
අඩුකළා:			
බොල් ණය සඳහා ප්‍රතිපාදන		(4,261,052.81)	(2,832,683.23)
		34,644,499.35	33,505,185.16
(14) භාණ්ඩ වට්ටෝරු			
ඉලෙක්ට්‍රොනික උපාංග		3,621,808.19	3,645,346.85
ලිපිද්‍රව්‍ය		1,945,296.60	2,041,450.62
වෙනත්		29,790.64	40,225.33
විද්‍යුත් හා යාන්ත්‍රික		203,648.96	237,735.01
සුභසාධක		37,537.00	57,573.00
උපාංග -TG		199,218.03	199,218.03
වට්ටෝරු භාණ්ඩ අයිතම - TG		518,035.98	518,035.98
වට්ටෝරු භාණ්ඩ අයිතම - ව්‍යාපෘති (P/C)		2,000,013.92	2,000,013.92
මෙවලම් - TG		1,392,996.69	1,387,166.69
		9,948,346.01	10,126,765.43
(15) පෙර ගෙවීම්			
අත්තිකාරම් ගෙවීම්- TG	(උපලේඛනය 07)	1,431,296.57	3,747,687.34
අත්තිකාරම් ගෙවීම් - PC	(උපලේඛනය 07)	137,524.35	19,000.00
මුද්දර අත්‍රිමය		9,032.00	10,132.00
SDB-ව්‍යාපෘතිය		721,648.94	
SDB-උපකරණ			121,789.32
		2,299,501.86	3,898,608.66

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල ඉතිරි කොටස 18 පිටුවට ගෙන යනු ලැබේ.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

(16) දේපළ, පිරියත හා උපකරණ

	2020 ජනවාරි 01 දිනට	එකතුකිරීම්	(අපහරණයන්) / ගැලපුම්	2020 දෙසැම්බර් 31 දිනට
	රු.	රු.	රු.	රු.
පිරිවැය				
සින්නක්කර වත්කම්				
ගොඩනැගිලි	182,714,758.01			182,714,758.01
වන්දිකා ඇන්ටනා	2,959,797.83			2,959,797.83
පරිගණක	77,591,974.63	906,000.00	(945,513.37)	77,552,461.26
පර්යේෂණාගාර උපකරණ	256,175,330.60	6,191,856.75	(6,264,287.16)	256,102,900.19
කාර්යාල උපකරණ	41,120,239.78	1,334,316.40	(1,650,767.60)	40,803,788.58
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	20,459,809.38	194,791.65	(581,140.17)	20,073,460.86
මෝටර් රථ	28,785,689.00			28,785,689.00
පුස්තකාල පොත්	24,427,283.97			24,427,283.97
	634,234,883.20	8,626,964.80	(9,441,708.30)	633,420,139.70
සමුච්චිත ක්ෂය කිරීම්				
සින්නක්කර වත්කම්				
ගොඩනැගිලි	60,584,059.67	9,135,737.90	(11,951.00)	69,707,846.57
වන්දිකා ඇන්ටනා	2,959,778.83			2,959,778.83
පරිගණක	52,073,102.07	6,897,611.10	(945,501.37)	58,025,211.80
පර්යේෂණාගාර උපකරණ	151,563,199.94	17,349,066.16	(6,258,247.86)	162,654,018.24
කාර්යාල උපකරණ	23,096,433.95	2,744,664.35	(2,068,371.60)	23,772,726.70
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	11,517,268.60	1,491,635.50	(578,013.81)	12,430,890.29
මෝටර් රථ	27,136,350.47	1,343,439.00		28,479,789.47
පුස්තකාල පොත්	23,939,829.87	147,558.52	(66,204.00)	24,021,184.39
	352,870,023.40	39,109,712.53	(9,928,289.64)	382,051,446.29
			**	
ඉදිරියට ගෙන ආ අගය	281,364,859.80			251,368,693.41

**

වසර තුළ වත්කම් අපහරණය කිරීමේ සමුච්චිත ක්ෂය කිරීම රු.9432330.14 වූ අතර ඊට අමතරව පෙර වසරේ වැඩියෙන් දක්වා ඇති ක්ෂය කිරීම ගිණුම්වල ගැලපුම් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල ඉතිරි කොටස 19පිටුවට ගෙන යනු ලැබේ.

නවින තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

		2020 රු.	2019 රු.
(17) සිදුකෙරෙමින් පවතින කාර්යයන් - ඉදිකිරීම්			
WIP - ගෘහ භාණ්ඩ හා සවිකිරීම් (කෑම කාමරය)		110,264.00	110,264.00
WIP - සීමා ලකුණු කිරීම හා ආරක්ෂාව (පිටපන)		3,545,744.40	3,545,744.40
		3,656,008.40	3,656,008.40
(18) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ			
ගෙවිය යුතු ගිණුම් -TG	(උපලේඛනය 08)	285,223.58	10,810,917.82
ගෙවිය යුතු ගිණුම් -PC	(උපලේඛනය 08)	79,530.70	75,893.43
වැටුප් හා වේතන පාලනය		174,525.00	443,118.50
E.P.F. පාලන		1,563,882.02	1,548,287.74
E.T.F. පාලන		187,665.84	185,073.28
සුභසාධක සමිතිය පාලනය		-	200.00
ණයගිමි - මහා භාණ්ඩාගාරය		900,764.56	1,127,230.29
ආපසු ගෙවන තැන්පතු		-	-
ලැබිම් මත ගෙවිය යුතු VAT - P/C		38,219.71	183,435.60
ලැබිම් මත ගෙවිය යුතු VAT - T/G		-	116,665.15
ගෙවිය යුතු NBT - TG			
ගෙවිය යුතු NBT - P/C		6,080.00	6,079.94
ගෙවිය යුතු මුද්දර බදු- TG		9,200.00	9,725.00
ගෙවිය යුතු උපයනවිට බදු - TG		1,366.00	69,402.76
උපයෝජනය පාලනය		2,501,217.45	3,424,345.22
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ණයගිමි		984,403.00	984,403.00
ආර්පිකෝ ඉන්ටීරියර්ස් - ණයගිමි		14,377.61	14,377.61
TG පාලන		(5,120,536.07)	(7,187,936.94)
රඳවාගැනිම්		1,817,186.03	1,842,618.85
ණයගිමි - ටී.එම්. වික්‍රමසිංහ		7,894.45	7,355.58
ණය හිමි - ඩබ්.ඩී. චාමිකා		8,535.13	-
ණය හිමි - ටී. දයාරත්න		8,323.89	-
ණය හිමි - එච්. විජේසූරිය		22,627.66	-
ණය හිමි - පී. මහදේවන්		7,283.49	-
ණය හිමි - එන්.ඒ.ඒ.එන්.දිල්රුක්ෂි		4,377.00	
සේවක සංගමය පාලනය			150.00
		3,502,147.05	13,661,342.83
(19) සමුච්චිත වියදම්			
භාණ්ඩාගාර අරමුදල්	(උපලේඛනය 09)	5,961,025.82	6,681,052.18
ව්‍යාපෘති/පාඨමාලා	(උපලේඛනය 09)	1,566,800.00	366,804.19
		7,527,825.82	7,047,856.37

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල ඉතිරි කොටස 20 පිටුවට ගෙන යනු ලැබේ.

ණයගිමි - ටී.එම්. වික්‍රමසිංහ

නවින තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

		2020 රු.	2019 රු.
(20) විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්			
වසර ආරම්භයේ ඇති ශේෂය		43,072,003.78	36,751,739.98
එකතු කිරීම් :			
වසර සඳහා ප්‍රතිපාදන		7,079,173.26	7,604,484.80
		50,151,177.04	44,356,224.78
අඩු කිරීම් :			
වසර තුල සිදුකළ ගෙවීම්		(472,637.50)	(1,284,221.00)
වසර අවසානයේ ශේෂය	(උපලේඛනය 10)	49,678,539.54	43,072,003.78
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා උපකල්පන			
වට්ටම් අනුපාතය		6.50%	6.50%
වැටුප් වැඩිවීම		8.00%	8.00%
කාර්ය මණ්ඩල පිරිවැටුම්		8.93%	8.93%
විශ්‍රාමගැනීමේ වයස		වසර 60	වසර 60
ශුද්ධ වත්කම්/ සමකොටස්			
(21) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන			
ආරම්භයේ ඇති ශේෂය		373,942,879.87	394,319,062.59
කාලසීමාව තුල ලැබූ ප්‍රදාන		29,117,000.00	57,000,000.00
ගැලපීම්		-	96,000.00
ධාරිනා සංවර්ධන වැඩසටහන		(11,869,688.22)	(41,164,653.88)
ක්‍රමක්ෂය		(37,522,163.42)	(36,307,528.84)
වසර අවසානයේ ශේෂය		353,668,028.23	373,942,879.87
මුදල් නොවන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන			
ආරම්භයේ ඇති ශේෂය		1,411,052.05	2,689,052.05
කාලසීමාව තුල ලැබූ ප්‍රදාන			
ක්‍රමක්ෂය		(1,278,000.00)	(1,278,000.00)
වසර අවසානයේ ශේෂය		133,052.05	1,411,052.05
අමාත්‍යාංශ ප්‍රාග්ධන ප්‍රදාන		13,156,751.40	13,156,751.40
		13,156,751.40	13,156,751.40
ප්‍රාග්ධන ප්‍රදාන		366,957,831.68	388,510,683.32

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල ඉතිරි කොටස 21 පිටුවට ගෙන යනු ලැබේ.

නවින තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

	2020 රු.	2019 රු.
(22) සංචිත		
පොදු සංචිත	272,721.64	272,721.64
සෙල්ටෙල් පරිත්‍යාගය	213,333.34	213,333.34
පර්යේෂණ හා උපදේශන අරමුදල	1,341,446.90	1,341,446.90
විදේශීය ප්‍රදාන	3,464,295.25	3,464,295.25
ප්‍රත්‍යාගණන අතිරික්තය	26,682,504.54	26,682,504.54
	31,974,301.67	31,974,301.67
පර්යේෂණ සංචිතය		
ආරම්භයේ ඇති ශේෂය	175,988.09	239,718.21
ලැබීම්	29,683.00	57,075.32
ගැලපීම්	(87.26)	(120,805.44)
වියදම්		
	205,583.83	175,988.09
	32,179,885.50	32,150,289.76
වෙනත් ප්‍රදාන හා පරිත්‍යාග		
ආරම්භයේ ඇති ශේෂය	23,375,926.37	23,625,193.98
ලැබුනු ස්ථාවර වත්කම්		88,550.00
ගැලපීම්		
ක්ෂය කිරීම්	(309,549.11)	(337,817.61)
	23,066,377.26	23,375,926.37
චක්‍රීය අරමුදල		
ආරම්භයේ ඇති ශේෂය	13,714,316.46	11,839,025.91
ලැබීම්	149,922.65	
ගැලපීම්	(48,112.15)	(131,945.59)
පොළී ආදායම	841,289.73	2,007,236.14
වියදම්		
	14,657,416.69	13,714,316.46
අධ්‍යක්ෂ මණ්ඩල අරමුදල		
ආරම්භයේ ඇති ශේෂය	1,507,989.80	1,330,163.27
පොළී ආදායම	165,802.63	180,552.17
ගැලපීම්	(62,539.17)	(2,725.64)
වියදම්		
	1,611,253.26	1,507,989.80

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල ඉතිරි කොටස 22 පිටුවට ගෙන යනු ලැබේ.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

	2020 රු.	2019 රු.
FINDS ප්‍රදානය		
ආරම්භයේ ඇති ශේෂය	7,675,740.06	6,967,522.63
පොලි ආදායම	579,443.08	708,434.23
වියදම්		(216.80)
	8,255,183.14	7,675,740.06
NASDA ප්‍රදානය		
ආරම්භයේ ඇති ශේෂය	7,251.87	6,914.97
ගැලපීම්		
පොලි ආදායම	265.37	571.62
වියදම්	(300.00)	(234.72)
	7,217.24	7,251.87
	79,777,333.09	78,431,514.32
(23) සමුච්චිත අතිරික්තය / (හිඟය)		
ආරම්භක ශේෂය -TG	(173,099,902.52)	(167,405,846.15)
ආරම්භක ශේෂය - P/C	46,501,908.50	33,276,673.60
ගැලපීම් - TG	876,014.18	(190,468.23)
ගැලපීම් - PC	(1,034,179.25)	4,264,426.32
වියදම් මත ආදායම් අතිරික්තය	2,509,743.31	3,457,220.43
	(124,246,415.78)	(126,597,994.03)
ශුද්ධ වත්කම් / සමකොටස් වල එකතුව	322,488,748.99	340,344,203.61

* ලැබුනු ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 20 අනුව ක්‍රමක්ෂය කර ඇත.
"රජයේ වියදම් ගිණුම්ගත කිරීම හා රජයේ සහය අනාවරණය කිරීම"

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

	2020 රු.	2019 රු.
(I) ආදායම - රජයේ ප්‍රදාන		
ක්‍රමක්ෂය	39,109,712.53	37,923,346.45
රජයේ ප්‍රදාන - ධාරිතා වර්ධනය	11,869,688.22	41,164,653.88
පුනරාවර්තන ප්‍රදාන	145,100,000.00	146,275,000.00
	196,079,400.75	225,363,000.33
(II) වෙනත් ආදායම්		
පාඨමාලා ගාස්තු	2,730,475.00	4,085,500.00
ප්‍රදාන ආදායම	-	-
පොළී ආදායම	1,456,579.55	1,559,665.92
ස්ථාවර තැන්පතු මත පොළී ආදායම	280,841.62	527,430.74
භාණ්ඩාගාර බිල්පත් මත පොළී ආදායම	734,201.74	908,281.09
වත්කම් අපහරණය මගින් ලාභය	43,533.84	-
විකුණුම් ආදායම / උපදේශණ ආදායම	5,842,852.46	7,710,095.02
වෙනත් ආදායම	1,287,110.08	3,502,945.00
විවිධ ආදායම	385,648.81	1,070,585.78
ටෙන්ඩර තැන්පතු	48,000.00	42,000.00
	12,809,243.10	19,406,503.55
(III) පුද්ගල පඩිනඩි		
පාලක මණ්ඩල සාමාජිකයන් සඳහා දීමනාව	232,500.00	336,000.00
E.P.F.	11,388,288.25	10,730,419.92
E.T.F.	2,275,407.72	2,146,084.05
ඉංජිනේරු දීමනාව	3,487,422.41	4,071,000.00
ඉන්ධන දීමනාව	2,904,349.68	2,675,454.36
පාරිතෝෂික	7,079,173.26	7,604,484.94
වෙනත් දීමනා	2,902,311.50	5,413,258.96
අතිකාල හා නිවාඩු දින ගෙවීම්	1,847,690.23	2,671,886.89
වෘත්තිය දීමනාව	2,004,454.19	2,072,890.52
වැටුප් හා වේතන	75,974,730.12	71,826,170.70
වාහන දීමනාව	7,285,483.87	7,200,000.00
වරලත් දීමනාව	1,260,000.00	765,000.00
	118,641,811.23	117,512,650.34
(IV) ගමන් වියදම්		
ගමන් - දේශීය	126,444.42	524,108.05
ගමන් - විදේශීය	-	1,523,548.00
	126,444.42	2,047,656.05

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

	2020 රු.	2019 රු.
(V) සැපයුම් හා අවශ්‍යතා		
ප්‍රදර්ශන හා සමූළු	-	10,000.00
ඉන්ධන	79,872.51	99,834.58
යාන්ත්‍රික හා විද්‍යුත් භාණ්ඩ / පර්යේෂණාගාර උපකරණ	28,850.08	151,932.27
වාර සඟරා	2,942.00	35,639.90
ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	454,665.78	1,507,302.86
තොග හානි	-	-
නිල ඇඳුම්	117,000.00	117,000.00
සුභසාධක අයිතම	395,676.00	815,330.00
	1,079,006.37	2,737,039.61
(VI) අළුත්වැඩියාවන් හා නඩත්තු කිරීම්		
ගොඩනැගිලි	4,313,963.72	4,676,717.12
පරිගණක	89,605.00	281,573.50
ක්ෂය කිරීම්	39,109,712.53	37,923,346.45
පර්යේෂණාගාර උපකරණ	5,387.64	606,581.79
100KVA විදුලි ජනකය	145,792.00	126,600.00
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	-	341,635.00
මෝටර් රථ	328,595.54	1,278,747.22
කාර්යාල උපකරණ	874,253.33	1,245,209.21
	44,867,309.76	46,480,410.29
(VII) ප්‍රවාහනය, සන්නිවේදනය උපයෝගිතා හා වෙනත් සේවාවන්		
වෙළඳ දැන්වීම්	1,020,573.00	1,663,820.00
විගණන ගාස්තු	350,000.00	400,000.00
බැංකු ගාස්තු	60,790.00	87,112.46
විදුලිය	3,681,301.63	5,509,544.14
සත්කාරක හා විනෝදාස්වාද	98,190.39	154,472.20
රක්ෂණ	6,837,716.11	2,527,367.89
බලපත්‍ර ගාස්තු	146,838.09	33,686.06
ජාතිය ගොඩනැගීමේ බදු වියදම්	712.50	173,018.60
වෙනත් වියදම්	912,063.21	1,517,911.10
තැපැල් ගාස්තු	37,790.00	83,440.00
ආරක්ෂක	3,002,802.60	3,240,582.25
මුද්දර ගාස්තු	2,100.00	4,100.00
දුරකතන	6,256,084.74	7,014,318.92
VAT වියදම්	9,810.00	92,473.50
ජලය	208,192.87	283,010.42
රැඳවා ගැනීමේ බදු මොබිටෙල්	-	121,135.89
රැඳවාගැනීමේ බදු	-	86,481.37
2017 වාර්ෂික වාර්තාව	112,013.00	392,310.30
විදුලිය - TRCSL		4,154.43
2018 වාර්ෂික වාර්තාව	58,180.00	16,200.00
2019 වාර්ෂික වාර්තාව	37,855.00	
බොල් ණය	1,428,369.58	(815,170.93)
	24,261,382.72	22,589,968.60

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛන - 2020 දෙසැම්බර් 31 (ඉතිරි කොටස)

	2020 රු.	2019 රු.
(VIII) ව්‍යාපෘති වියදම්		
පාඨමාලා/ව්‍යාපෘති	3,950,270.61	4,103,123.21
	3,950,270.61	4,103,123.21
(IX) පර්යේෂණ හා සංවර්ධන වියදම්		
පර්යේෂණ හා සංවර්ධන වියදම්	11,869,688.22	41,164,653.88
උපදේශක ගාස්තු	12,000.00	4,000.00
	11,881,688.22	41,168,653.88
(X) වෙනත් මෙහෙයුම් වියදම්		
සාමාජිකත්ව ගාස්තු	161,438.37	145,780.84
වෘත්තීය ගාස්තු	-	-
කාර්ය මණ්ඩල පුහුණු	4,000.00	1,531,492.92
	165,438.37	1,677,273.76

9.0 සැලසුම්කල කෙටි හා මධ්‍ය කාලීන ක්‍රියාකාරකම් සාරාංශය

- **මූලික අභ්‍යවකාශ තාක්ෂණයන්හි ජාතික ධාරිතාවන් අත්කර ගැනීම හා වැඩිදියුණු කිරීම-**

  - 2019 වසරේ ජූනි මස ශ්‍රී ලංකාවේ පලමු ඝනක චන්ද්‍රිකාව වන රාවණා-1 සාර්ථක ලෙස වැඩිදියුණුකර කක්ෂගත කිරීමෙන් අනතුරුව ජපානයේ කියුෂු තාක්ෂණ ආයතනය (Kyutech) සමග තවදුරටත් සහයෝගීතා පර්යේෂණ ක්‍රියාකාරකම් වල නිරත වෙමින් ACCIMT ආයතනය 2019 අවසානයේ කිට්සුනේ (Kitsune) නම් සය-ඒකක නැනෝ චන්ද්‍රිකාව නිර්මාණය හා වැඩිදියුණු කිරීම සඳහා වන සහයෝගිතා ව්‍යාපෘතියකට එක්වූ අතර එය 2021 අවසානය වනවිට නිම කිරීමට සැලසුම් කෙරේ.

  - අභ්‍යවකාශ තාක්ෂණයේ ප්‍රධාන වශයෙන්ම නැනෝ චන්ද්‍රිකා ක්ෂේත්‍රයේ ජාතික හැකියාවන් ලබාගැනීම සඳහා අභ්‍යවකාශ තාක්ෂණයේ ප්‍රමුඛ රටවල් සමග සහයෝගිතා ක්‍රියාකාරකම් ඉදිරියටත් සිදුකිරීම.

  - 3-U නැනෝ චන්ද්‍රිකාව සැලසුම් කිරීම හා වැඩිදියුණු කිරීම.

- **ශ්‍රී ලංකාවේ ගුවන් අභ්‍යවකාශ සැලසුම් හා නිපදවීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම** –

  නියත තටු ගණනක් ඇති UAV යානා හා ස්ථායිතාව, හැසිරවිමේ හැකියාව, විවිධ යෙදවුම් සඳහා සුදුසු ව්‍යුහයන් සහිතව නිර්මාණය කරන ලද තටු හතරක්/හයක් සහිත සැහැල්ලු යානා තාක්ෂණයන් වැඩිදියුණු කිරීම. බහු භ්‍රමණ තටු, සේවාලාභී අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයේ සිරස්ව ගුවන්ගත කළහැකි හා ගොඩබෑමේ හැකියාව (VTOL) හා උසස් ලක්ෂණ සහිත ටේලි සිටර් ආකාරයේ UAV යානා සැලසුම් කිරීම

- **ශ්‍රී ලංකාවේ මෙකාට්‍රොනික් හා රොබෝටික් හැකියාවන් වැඩිදියුණු කිරීම** - කාර්මික යෙදවුම් සඳහා සුදුසු "ස්වායත්ත යෙදවුම් සඳහා ජංගම රොබෝ වේදිකාවක්" සේවාලාභී අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයෙන් වැඩිදියුණු කිරීම.

- **පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ලබාගැනීම හා බෙදාහැරීම සඳහා ජාතික මධ්‍යස්ථානය** - සිවිලියන් පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රකා මගින් පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රකා දත්ත ලබාගැනීම සඳහා භෞමික මධ්‍යස්ථාන සංකීර්ණයක් සහ තාක්ෂණික පාලනයට අදාල යටිතල පහසුකම් ස්ථාපනය කිරීම, දත්ත සැකසීම හා බෙදාහැරීම පළමු අදියරට අයත්වේ. අභ්‍යවකාශ තාක්ෂණයේ ප්‍රමුඛ රටක් මගින් ලැබෙන උපකරණ ප්‍රදානයන් හා තාක්ෂණ සහය සමගින් ව්‍යාපාතියේ පළමු අදියර සිදුකිරීමට සැලසුම්කර ඇත.

- **දුරස්ථ සංවේදි හා භූගෝලීය තොරතුරු පද්ධතිය (RS/ GIS) සම්බන්ධ කටයුතු** - කෘෂිකාර්මික, වැවිලි, පාරිසරික, ස්වභාවික සම්පත් කළමනාකරණය ආදි ක්ෂේත්‍රයන් සඳහා පෘථිවි නිරීක්ෂණ (EO) චන්ද්‍රිකා ඡායාරූප හා ගුවනේ සිට ගත් (UAV) ඡායාරූප යොදා ගැනීමේ ව්‍යාපෘති.

- ACCIMT ආයතනයේ විදුලිසැර වලින් ආරක්ෂාවිමේ ජාතික මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් තවදුරටත් පුළුල් කිරීම.

- පූර්ව දැනුම්දිය හැකි නඩත්තු ඒකකයක් ACCIMT ආයතනයේ ස්ථාපනය කිරීම.

- ඉලෙක්ට්‍රොනික, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික හා සන්නිවේදන ක්ෂේත්‍රයේ ව්‍යාපෘති (කාර්මික විසඳුම් හා ඉහළ සමාජ ආර්ථික පලපෑමක් ඇති ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා)

- ඉලෙක්ට්‍රොනික, සන්නිවේදන, රොබෝ තාක්ෂණ, තොරතුරු තාක්ෂණ හා දුරස්ථ සංවේදනය/GIS ක්ෂේත්‍රයන්හි අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්

- ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපකරණවල ගැටලු විසඳීම හා දෝෂ පිළිසකර කිරීම් පිළිබඳ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන්

- තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති හා තාරකා විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම්

- කාර්යසාධන පරීක්ෂා කිරීම/සහතික කිරීම හා ක්‍රමාංකන ආශ්‍රිත ක්‍රියාකාරකම්

- අතිනවීන ඉලෙක්ට්‍රොනික පද්ධති (උදා: දුම්රිය එන්ජින් වල ප්‍රධාන පාලක ඒකක), මිනුම් උපකරණ හා වෛද්‍ය උපකරණවල දෘඩකාංග පිළිසකර කිරීම්.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඒඊසී/ඒ/ඒසිසිඅයිඑම්වී/2020/10 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 ජූලි 19 දින

සභාපති,
නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරවිකිරීම් අගයනලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරවිකිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයනලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව	විස්තරය
(අ) අංක 03/2015 සහ 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5)	නිකුත් කරන ලද අතුරු අග්‍රිමයක වියදම් නොවී ඉතිරිවන මුදල් ශේෂය අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවද, 2020 වර්ෂයේදී අවස්ථා 02 කදී නිකුත් කළ රු.181,000 ක අත්තිකාරම් මුදල් එසේ පියවා නොතිබූ අතර තත්කාර්ය අතුරු අග්‍රිමයක්

නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත නැවත පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් මුදල් පියවීම මාස 01 සිට මාස 05 දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද වී තිබූ අවස්ථා 16 නිරීක්ෂණය විය.

(ආ) 5.4.4 වගන්තිය

ප්‍රසම්පාදන අස්ථිත්වයට පිළිගත හැකි අත්තිකාරම් සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත අත්තිකාරම් මුදලක් ලබා දිය හැකිය. එසේම කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීම සඳහා නියමිත කාලසීමාව දීර්ඝ කිරීමකදී ප්‍රසම්පාදන අස්ථිත්වය මෙම සුරක්ෂණය දීර්ඝ කරන ලෙස සුරක්ෂණකරුගෙන් ඉල්ලා සිටීම සඳහා පියවර ගත යුතු වුවත් ශ්‍රවනාගාරය සඳහා රු.3,981,730 ක්වූ ලීබඩු උපකරණ මිලදී ගැනීමේදී රු.915,798 ක්වූ අත්තිකාරම් සුරක්ෂණයේ කාලය දීර්ඝ කරන ලෙස ආයතනය ඉල්ලීම් කර තිබුණද සැපයුම්කරු එම දීර්ඝ කිරීම් සිදුකර නොතිබූ අතර ආයතනය ඒ සම්බන්ධයෙන් වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 5.4.8 වගන්තිය

කාර්යසාධන සුරක්ෂණ සහතිකය වැඩ නිම කිරීම හෝ භාණ්ඩ සැපයුම නිම කිරීමට හෝ නියමිත දිනයෙන් ඔබ්බට දින 28 ක් දක්වා වලංගු විය යුතු නමුත් නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රධාන ශ්‍රවනාගාරය සඳහාවූ රු.3,981,730 ක්වූ ලීබඩු උපකරණ හා රු.5,639,360 ක්වූ ශබ්ද විකාශන පද්ධතිය (Audio system) මිලදී ගැනීමේදී සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ කාර්යසාධන සුරක්ෂණයන්වල වලංගු කාලසීමාව ඉක්මවා තිබුණ ද, කාලය දීර්ඝ කිරීමක් සිදු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 අනෙකුත් කරුණු

(අ) හෝමාගම, පිටිපන පිහිටි අක්කර 10 ක් වූ ඉඩම වඩා වැටක් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව නාගරික සංවර්ධන අධිකාරිය තෝරා ගෙන තිබුණ අතර, වැට ඉදිකිරීම කටයුතු ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් මුදලක් වශයෙන් ලබා දිය හැකිව තිබිය දී ඇප සුරක්ෂණයක් ද රහිතව මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.3,543,744 ම අදාළ ආයතනය ගෙවා තිබුණ අතර, 2020 දෙසැම්බර් 31 වන විටත් වැට ඉදිකර නොතිබුණි. එම ව්‍යාපෘති නතර වී තිබුණ අතර, අදාළ මුදල් ආපසු ලබා ගැනීමට ආයතනය අපොහොසත්ව තිබුණි.

(ආ) ආයතනය සතු විදුලි සංදේශ කුළුණු විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත කුලී පදනම මත ලබාදී ඇති අතර විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ 2017 අගෝස්තු 01 සිට 2022 ජූලි 31 දක්වා වූ වසර 05 ක කාලයකට ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව ලැබිය යුතු ආදායමෙන් 2019 අගෝස්තු දක්වා කාලයට අදාළ හිඟ ආදායම රු.2,292,945 ක් වී තිබුණි. මෙම හිඟ මුදල් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අය කර ගැනීමට අපොහොසත්වී තිබුණි. නිසි නඩත්තු සැලැස්මක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මෙම කුළුණු මේ වන විට දිරාගොස් ඇති බව නිරීක්ෂණය විය.

ඩබ්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

2.2 ලිඛිත නීති රීති හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විදිවිධාන වලට අනුකූල නොවීම

(අ) විගණන නිරීක්ෂණයේ අත්තිකාරම් මුදල් පියවීමේ ප්‍රමාදය මාස 1 - 5 ත් කාල පරාසයක් තුළ ප්‍රමාද වී තිබූ අවස්ථා 16 ක් ලෙස දක්වා ඇතත් එකී කාල පරාසයේ මාස 4 ට වැඩි ප්‍රමාදයන් සිදුවූ අවස්ථා ගණන 5 කි. එබදු වැඩි කාල පරාසයක ප්‍රමාදයන් සිදු වී ඇත්තේ තාක්ෂණික කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය මෙවලම්, උපාංග මිලදී ගැනීමට අත්තිකාරම් ලබා ගෙන ඇති අතර ඇතැම් අවස්ථාවල පියවීමේ දී ප්‍රායෝගික ගැටළු සිදුවී ඇත.

එසේ වුවද අදාල නිලධාරීන්ට මේ පිළිබඳව දැනුම් දීම සිදුකර ඇති අතර ප්‍රමාදයන් වලක්වා පියවීමට කටයුතු කරන මෙන් දන්වා උපදෙස් ලබා දී ඇත. ඒ අනුව මෙබදු අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයන් අවම කිරීමට සුදුසු පියවර ගෙන ඇත.

(ආ) 5.4.4 වගන්තිය

විගණන නිරීක්ෂණයේ සඳහන් අත්තිකාරම් සඳහා වූ සුරක්ෂණයේ කාලය දීර්ඝ කිරීමට ආයතනය ඉල්ලුම් කල ද පසුව දීර්ඝ කිරීම අවශ්‍ය නොවුයේ ප්‍රසම්පාදනය එම අවස්ථාව වන විට සියයට අනුවක (90%) ප්‍රමාණයකට වඩා නිම කොට තිබූ බැවිනි. එනම් මිලදී ගැනිමට අදාළ උපකරණ සියල්ල ආයතනය වෙත ලබා දී තිබු අතර උපකරණ සවි කිරීමේ ඇති වූ තාක්ෂණික ගැටළුවක් මත සිදු වූ ප්‍රමාදයක් හැරුණු කොට ප්‍රසම්පාදන කොන්දේසි වලට අනුගතව සිදු වූ බව දන්වනු කැමැත්තෙමි.එමෙන්ම ප්‍රසම්පාදන ප්‍රමාදයන් සඳහා 10% උපරිමය දක්වා වූ ප්‍රමාද ගාස්තු අය කර ගැනීමටද කටයුතු කර ඇත.

5.4.8. වගන්තිය

විගණන නිරීක්ෂණයේ සඳහන් ප්‍රධාන ශ්‍රවනාගාරය සඳහා ලී බඩු උපකරණ සහ මාසදිහිඑප මිලදී ගැනීමේදී ද කාර්යසාධන සුරක්ෂණ වල වලංගු කාලය තුල අදාළ කාර්යන් සියයට අනුවකට (90%) වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇත.එමෙන්ම එහිදී යම් යම් තාක්ෂණික කරුණු මත පැන නැගුනු දෝෂ මත සිදු වූ ප්‍රමාදයන් සඳහා ද 10% උපරිමයකට යටත්ව ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කර ඇත.

2.3 අනෙකුත් කරුණු

(අ) පෘතුවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ප්‍රතිග්‍රහණය හා බෙදාහැරීම පිණිස යෝජිත ව්‍යාපෘතිය සඳහා බස්නාහිර සහ මහනගර අමාත්‍යංශය මගින් ක්‍රියාත්මක කරන ලද තාක්ෂණ නගර ව්‍යාපෘතිය(ඔැජයබඳ කසඑහ) යටතේ විගණන නිරීක්ෂණයේ සඳහන් හෝමාගම පිටිපන පිහිටි අක්කර 10ක ඉඩම ආතර් සී ක්ලාක් ආයතනයට වෙන් කරන ලදී. තාක්ෂණ නගර ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් හි නියුතු ආයතන සහ විශ්ව විද්‍යාල සඳහා ඉඩම් වෙන් කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කරන ලදී.

හෝමාගම පිටිපන පිහිටි මෙම අක්කර 10 ක ඉඩම අප ආයතනය සඳහා වෙන් කරන ලද සමස්ථ භූමි භාගය තුල ඇතුලත්ව තිබූ අතර ඒ වන විට ඉඩමෙහි සිමා මායිම් ස්ථිර වශයෙන් මායිම් වැටකින් වෙන් කර නොතිබූ බැවින් හා අදාළ ඉඩම් ඒ ඒ ආයතන වෙත වෙන් වෙන් වශයෙන් පවරා දීමේ පරිපාලනමය ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම අවසන් වී නොතිබුණු බැවින් ඉහත කී ආයතන සඳහා එම ඉඩම් වෙන් කොට ලබා දීමේ ව්‍යවස්ථාපිත කාර්යයභාරය හිමි රාජ්‍ය ආයතනය ලෙස නාගරික සංවර්ධන අධිකාරිය මගින්ම ඉහත වැට ඉදිකරවා ගැනීම,අනුගමනය කල හැකිව තිබූ වඩාත් නිරවුල් හා ප්‍රශස්ථ ක්‍රියාමාර්ගය බව පෙනී ගිය බැවින් අදාළ කාර්යය නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරන ලදී.

කෙසේ වෙතත් පසුව පැන නැගුණු යම් යම් තාක්ෂණ කරුණු සහ ප්‍රදේශවාසීන්ගේ විරෝධතා හේතුකොට ගෙන අවස්ථා දෙකකදී (2) ඉහත කාර්යය සඳහා විකල්ප ඉඩම් හඳුනා වෙන් කොට දීමට නාගරික සංවර්ධන අධිකාරියට සිදු විය.

එම නිසා වැට ඉදි කිරීමේ කාර්යය නිශ්චිත වශයෙන් ඉටු කිරීමට ප්‍රමාද වී ඇත. එහෙත් නාගරික සංවර්ධන අධිකාරිය මගින් යෝජිත නව ඉඩම වෙන්කර දීම තහවුරු වූ පසු එම ඉඩම සඳහා වැට ඉදි කිරීමේ කාර්යයට අදාළ මුදල් හිලව් කිරීමට නියමිතය. එම නිසා අදාළ ගෙවීම රාජ්‍ය මට්ටමේ ව්‍යාවස්ථාපිත ආයතනයකට කරන ලද විධිමත් ගෙවීමක් වන අතර කාල ප්‍රමාදයක් සිදු වුවද එය ඵලදායී ගණුදෙනුවක් ලෙස ඉදිරියේදී එය යොදා ගැනීමට නියමිතය.

(ආ) වර්ෂ 2010 සිට 2017 දක්වා කල්බදු ගිවිසුම් දෙකක් හරහා මෙම විදුලි සංදේශන කුළුණු සේවාව, විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව වෙත ලබා දී ඇති අතර 2017.07.31 දින අවසන් අවුරුදු 2 කල්බදු ගිවිසුම කල් ඉකුත්වීමෙන් පසුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කළ පරිදි නැවතත් විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව සමඟ වසර 5 ක කල්බදු ගිවිසුමක් සඳහා එකඟතාවයකට පැමිණි එම ආයතනය 2019.03.28 දින ඒ සඳහා සිය කැමැත්ත ප්‍රකාශ කරන ලදී.

කෙසේ වෙතත්, 2017.08.01 සිට 2022.07.31 දක්වා වසර 5 ක කාලයක් සඳහා යෝජිත මෙම ගිවිසුම අත්සන් කිරීමට කටයුතු සම්පාදනය වෙමින් තිබූ බැවින්, අප ආයතනය විසින් විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවට අයත් ඇන්ටෙනාව සහ ඒ ආශ්‍රිත උපකරණ වල සුරක්ෂිතතාවය හා සේවාව ලබා දී ඇත. පෙර ගිවිසුම් කාලපරිච්ඡේද වලදී ද ගිවිසුම් අත්සන් කිරීමේදී ඔසෘඞ්ඛ හි ප්‍රමාදයන් පැවතුනද, ප්‍රමාදයන් නොතකා පසුව ගෙවීම් නිසි පරිදි ආයතනයට ලබා දීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, 2019.08.19 දින, ඔසෘඞ්ඛ විසින් තවදුරටත් මෙම ඇන්ටනා කුළුණු සේවාව ලබා ගැනීමට අපේක්ෂා නොකරන බව 2019.07.31 දිනැති ලිපිය මගින් අප වෙත දැනුම් දී ඇත.

එබැවින් අප ආයතනය විසින් ඔසෘඞ්ඛ වෙත 2017.08.01 සිට 2019.07.31 දක්වා වූ වසර 2 ක සේවා කාලය සඳහා වූ රු. 2,292,945.12 ක ගෙවීම් පියවීමට සහ ඔවුන්ගේ උපකරණ ඉවත් කිරීම සඳහා ඉල්ලීම් හා සිහි කැඳවීම් කිහිපයක් කර ඇත. එහෙත් එයට නිසි ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නැත.එම මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.

මෙම සංඥා කුළුන වසර 25 කට වඩා පැරණි වන අතර දැනට භාවිතා වන තාක්ෂණයත් සමඟ මෙබඳු කුළුනක් බදු දීමට ඇති හැකියාව අඩු අතර එවැනි ගිවිසුම්ගත ආයෝජනයක් ඵලදායී නොවන බව බාහිර සාමාජිකයන්ගෙන් ද සමන්විත ඉංජිනේරු කමිටුවක් මගින් ද නිර්දේශ කර ඇත. එම කමිටුවේ නිගමනය පරිදි අදාළ කුළුන ගලවා ඉවත් කර ඒ හා පවතින අවදානම් තත්ත්වය මගහැරවීමට අවශ්‍ය පියවර මේ වන විට ද ගෙන ඇත.

අත්සන් කලේ,
ඉංජිනේරු සනත් පනාවැන්නගේ
අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය